මානුෂීය සේවායතන සමූහය

පෙබරවාරි 2009

# ක්ෂණික තතු විමසුම - (Rapid Context Assessment )

CONSORTIUM OF CHA HUMANITARIAN AGENCIES (GTE) LIMITED

ජාතික විශ්ලේෂණය


දේශපාලනය 2

පාලනය 2

ආරක්ෂක තත්ත්වය 2

මානව හිමිකම් 3

ආර්ථික සන්දර්භය 4

පරිසරය 4

සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය 4

මානුෂිය හා සංවර්ධන අවකාශය 5

බාහිර ක්‍රියාකාරීන් 6


දිස්ත්‍රික්ක විශ්ලේෂණ


අම්පාර 6

මඩකලපුව 6

කොළඹ 7

යාපනය 7

මන්නාරම 7

ත්‍රිකුණාමලය 8

වව්නියාව 8


ප්‍රවනතාවන් විශ්ලේෂණය කිරීම

| | |
|---|---|
| දේශපාලන සංදර්භය | → |
| පාලනය | ↘ |
| ආරක්ෂක තත්ත්වය | ↘ |
| මානව හිමිකම් | ↘ |
| ආර්ථික සන්දර්භය | → |
| පරිසරය | → |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | → |
| මානුෂිය හා සංවර්ධන අවකාශය | → |
| බාහිර ක්‍රියාකාරීන් | ↘ |

දර්ශකය

## සාරාංශය



**පෙ**බරවාරි මාසය තුළ දේශපාලනමය තත්වය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී සැලකිය යුතු වෙනසක් සිදු නොවීය. දිවයිනේ සම්පූර්ණ දේශපාලන ග්‍රහණය රජය සතු බව පෙනී යයි. රජයේ මැතිවරණ බලය කිසිසේත් ම අභියෝගයට ලක් වී නොමැත. පැමිණෙන මහ මැතිවරණයේ දී සෙසු පාර්ලිමේන්තු පක්ෂවල සහයෝගයෙන් තොර ව ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා අවශ්‍ය තුනෙන් දෙකක බලයක් ලබා ගැනීම රජයේ අපේක්ෂාව බව පෙනේ. නායකත්වය පිළිබඳ ගැටලුව නිසා ප්‍රධාන විපක්ෂය අවාසනාවන්ත ලෙස කණ්ඩායම්වලට බෙදී ඇත. දැනට විපක්ෂ නායක වශයෙන් සිටින රනිල් වික්‍රමසිංහ මහතා වෙනුවට වෙනත් අයෙක් පත් කිරීමට පක්ෂයේ සමහරුන් තුළ අදහක් පැවතියත් සෙසු අයගේ අදහස වන්නේ එමගින් පක්ෂය තව දුරටත් දුර්වල වනු ඇති බවයි. යුද අරගලයෙන් එල්ටීටීඊ සංවිධානය පරාජය ලබන බව නිසැකයෙන් ම පෙනී ගියත් මෙය අර්බුදයට විසඳුමක් නොවේ. මේ ගැටලුව විසඳීම සඳහා දේශපාලන විසඳුමක් අවශ්‍ය වන අතර පසු යුද අර්බුදයෙන් ගොඩ ඒමට සහාය වීම සඳහා අනුග්‍රාහකයින් සොයා ගැනීමේ කාර්යයේ දී ද මෙය වැදගත් වනු ඇත.

පළාත් සභා මැතිවරණයේ දී ද යහ පාලනයේ හා බලය බෙදීමේ ඇති දුර්වලතාවය ප්‍රදර්ශනය විය. මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයේ දී ප්‍රධාන මාතෘකා බවට පත් වී තිබුණේ යුද්ධය මිස ප්‍රාදේශීය වශයෙන් පවතින ගැටලු නොවේ. මේ අතර තමා සතු සම්පත් සීමිත වීම නිසා සිය පාලන හැකියාව සීමිත වී ඇති බවට නැගෙනහිර පළාත් මහ ඇමතිවරයා මැසිවිලි නගනු දක්නට විය. ඝාතනය කිරීම්, අතුරුදන් කිරීම් හා පැහැරගෙන යාම් ආදී මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පසුගිය මාස හා සසඳන විට ප්‍රමාණයෙන් අඩු වී තිබිණි. යහ පාලනයක් නොමැතිව දීර්ඝ කාලීනව පවතින සාමයක් අපේක්ෂා කළ හැකි නොවේ. මේ ගැටලු සම්බන්ධයෙන් සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය ද පසු ගිය මාසය තුළ අවම මට්ටමක පැවතිණි. මේ ගැටලු සම්බන්ධයෙන් ඵලදායී පියවරක් ගැනීමට තරම් දේශපාලන විපක්ෂය ද ශක්තිමත් නොවීය. මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සෙනෙට් මණ්ඩලය විසින් රජය හා එල්ටීටීඊ සංවිධානය යන දෙපාර්ශ්වයට ම චෝදනා එල්ල කර ඇත.

පෙබරවාර මාසය තුළ සිදු වූ ගැටුම්වලින් එල්ටීටීඊ සංවිධානයට ප්‍රධානත ම හමුදා මෙන් ම නාවික බලය ද අහිමි වී ගියේය. සිය භූමි ප්‍රමාණය, යුධ උපකරණ මෙන් ම පිරිස් බලය සීමා වීම යන පසුබිම තුළ එල්ටීටීඊ සංවිධානය කොළඹ නගරයට මරාගෙන මැරෙන ගුවන් ප්‍රහාරයක් එල්ල කිරීම, හමුදා සෙබලුන්ට හා සිවිල් වැසියන්ට මරු කැඳවමින් අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මුරපොළවල දී මරාගෙන මැරෙන ප්‍රහාරයන් එල්ල කිරීම් හා මායිම් ගම්මානවල වැසියන්ට ප්‍රහාර එල්ල කිරීම ආදී පියවර ගැනීමට පෙළඹී සිටිනු දැකිය හැකි විය. රජයේ යුධ ව්‍යාපාරය නිසා ද සිවිල් වැසියන් සැලකිය යුතු ප්‍රමාණයකට තුවාල සිදු වී ඇත. මේ අතර සිවිල් වැසියන් මිනිස් පලිහක් සේ යොදා ගැනීම සම්බන්ධයෙන් රජය විසින් එල්ටීටීඊයට චෝදනා නැගීම සිදු වුවත් එල්ටීටීඊ සංවිධානය මේ චෝදනා ප්‍රතික්ෂේප කරයි.

පසුගිය මාසය තුළ ආර්ථික ක්ෂේත්‍රයේ මිශ්‍ර ප්‍රතිඵල දැකිය හැකි විය. තේ හා රබර් මිල පහළ බැසීම සිදු වූ අතර මෙරටට පැමිණෙන සංචාරකයන්ගේ ප්‍රමාණය ද අඩු වී තිබිණි. රටේ විදේශ විනිමය සංචිතය පහළ බසිමින් ඇති අතර මේ තත්වය දිගින් දිගටම පැවතුනහොත් රජයට අන්තර්ජාතික මූල්‍ය අරමුදලින් ණය මුදලක් ලබා ගැනීමට සිදු වනු ඇත. ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගමේ බිඳ වැටීමෙන් කම්පනයට පත් ව සිටින මූල්‍ය හා කල්බදු සමාගම්වලට රුපියල් බිලියන 4.5 ක ඇපකර සැලැස්මක් ලබා දීමට රජය පාර්ශ්වයෙන් යෝජනා ඉදිරිපත් වී ඇත.
පෙබරවාරි මාසය තුළ ආර්ථිකමය වශයෙන් සිදු වූ යහපත් ප්‍රවණතාවක් සේ උද්ධමනය තවදුරටත් පහළ බැසීම දැක්විය හැකිය. අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල පහල යෑම හා දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම මෙයට හේතු වී තිබේ. බැංකු ණයකර තව දුරටත් ලාභදායී කිරීම සඳහා බැංකු පොළී අනුපාතිකයන් පහළ දැමීමට මහ බැංකුව කටයුතු කර ඇත. යුද්ධය නිමා වීමත් සමග ව්‍යාපාරික ප්‍රජාව අනාගතය කෙරෙහි නව බලාපොරොත්තු සහිතව පසුවෙති. එහෙත් පසුගිය මාසය තුළ කොටස් වෙළඳපල 7% පාඩුවක් ලබනු දැකිය හැකි විය.

ශ්‍රී ලංකා ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය හා ඩයලොග් ටෙලිකොම් සමාගම එක්ව දිවයින පුරා ක්‍රියාත්මක වන ආපදා හා හදිසි අවස්ථාවන් පිළිබඳ අනතුරු ඇඟවීමේ ජාලයක් (DEWN) ක්‍රියාවට නංවා ඇත. මෙ මගින් ඩයලොග් ජංගම දුරකථන හරහා අනතුරු ඇඟවීම සිදු වනු ඇත. ශ්‍රී ලංකා වානිජ හා කර්මාන්ත මණ්ඩලය (FCCISL) මගින් ප්‍රමුඛ පෙලේ කර්මාන්ත පහක් අරමුණු කරගෙන පරිසර හිතකාමී පුරුදු වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කර තිබේ. උතුරු ප්‍රදේශයේ සිට පැමිණෙන අභ්‍යන්තර අවැතැන් වූවන් වෙනුවෙන් කඳවුරු තැනීම නිසා ජල, ජලාපවහන මෙන් ම සෞඛ්‍ය පිළිබඳ ගැටලු මතු වී තිබේ. එසේම වන වගා එළි කිරීම ද මේ නිසා ඇතිවන ගැටලුවකි.

| | | | | | |
|---|---|---|---|---|---|
| *වෙනසක් නැත* | → | *මඳ ප්‍රගතියක් පෙන්වයි* | ↗ | *මඳ පිරිහීමක් පෙන්වයි* | ↘ |
| *සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වයි* | ↑ | *සැලකිය යුතු පිරිහීමක් පෙන්වයි* | ↓ | | |

# ජාතික විශ්ලේෂණය 2009 ජනවාරි28 - 2009 පෙබරවාරි 28

## දේශපාලන සංදර්භය



එක්සත් ජනතා නිදහස් සංධාන රජය ඉතිරි පළාත් සභා දෙකේ එනම් දකුණු හා ඌව පළාත් සභාවල මැතිවරණ බස්නාහිර පළාත් සභා මැතිවරණය අවසන් වන තෙක් කල් දමා ඇත. එක ම පළාත් සභාවක වත් බලය හිමි කර ගැනීමට එක්සත් ජාතික පක්ෂය සමත් වී නොමැති අතර එක්සත් ජනතා නිදහස් සන්ධාන පාලනය කෙරෙහි සැලකිය යුතු තරම් බලපෑමක් ඇති කළ හැකි තරම් ආසන සංඛ්‍යාවක් ලබා ගැනීමට ද ඔවුන් සමත් වී නැත.

එක්සත් ජාතික පාක්ෂිකයින්ගෙන් කොටසක් වත්මන් නායක රනිල් වික්‍රමසිංහ මහතා වෙනුවට ජනතා ආකර්ෂණයක් සහිත වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගත හැකි නායකයෙක් පත් කළ යුතු බවට ප්‍රබල මතයක් ගොඩනගමින් සිටියත් සෙසු පිරිසගේ මතය වන්නේ එමගින් පක්ෂය දෙකට බෙදීමක් සිදුවන බවත් මෙය පළාත් සභා මැතිවරණයකින් පරාජයය පත් වීමට වඩා බැරෑරුම් වන බවත් ය.
ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පසුගිය මහ මැතිවරණයේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානය තැනීමට එක් වූ සෙසු පක්ෂ හා දැනට එයට එක් වීමට බලාපොරොත්තුවෙන් පසුවන පක්ෂ එක් ලකුණක් යටතේ එක් පක්ෂයක් සෑදීමේ අපේක්ෂාව සහිතව සිටිති. කෙසේ වෙතත් මනාප තරගයේ දී වැඩි මනාප ප්‍රමාණයක් ලබා ගැනීමේ අපේක්ෂා පෙරදැරිව සිටින අපේක්ෂකයන්ට මෙමගින් දුෂ්කර තත්වයක් උදා වනු ඇත. මක් නිසාද යත් මෙසේ සිදු කිරීම මගින් එක් දිස්ත්‍රික්කයක් තුළ මනාප සටන සඳහා දැඩි තරගයක් ඇති වනු ඇති හෙයිනි. එක් ඡන්ද ලකුණක් යටතේ තරග කිරීමෙන් මෙම තත්වය මතු වනු ඇත.

ව්‍යවස්ථා සංශෝධනයකට ඉඩකඩ සලසන ආකාරයට පාර්ලිමේන්තුවේ බහුතර බලයක් ලබා ගැනීම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඒකායන අපේක්ෂාව වී ඇත. මෙසේ බහුතර බලයක් ලබා ගැනීමට නම් සම්පූර්ණ පාර්ලිමේන්තු ආසන සංඛ්‍යාව වන 225න් 150ක් වත් (2/3) ලබා ගත යුතු වේ. ව්‍යවස්ථාව මගින් මෙය අවධාරණය කර ඇත.

දේශපාලන සටන උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලින් පිටත සිදු වෙද්දී ආරක්ෂක හමුදා එල්ටීටීඊයේ අවසාන බල ප්‍රදේශ වෙත ළඟා වෙමින් සිටියි. මේ තත්වය දැනට පවතින රජයේ ජනප්‍රියත්වය තව දුරටත් වැඩි දියුණු කිරීමට හේතු වී ඇත. දැනට පවතින මැතිවරණවල ජනප්‍රිය මාතෘකාව යුද්ධය බව ට පත් වී ඇති අතර දිනෙන් දින දුර්වල වෙමින් පවතින ආර්ථික පහළ බැස්ම කාර්යක්ෂම ලෙසින් පාලනය කිරීමේ හැකියාවක් රජයට නොමැති බව පෙනේ.

උතුරු නැගෙනහිර ප්‍රදේශවල දිගටම පවත්නා සාමයක් ඇති වේ නම් ඒ ප්‍රදේශවල සංවර්ධන කාර්යයන්වලට ඩොලර් බිලියන ගණනක් ලබා දීමට සාම ක්‍රියාවලියේ සම නියමුවන් (නොර්වේ, ජපානය, ඇමරිකාව හා යුරෝපා සංගමය) සූදානමින් සිටියි. එහෙත් ඔවුහු තවමත් දේශපාලන විසඳුමක් අපේක්ෂා කරති.

## පාලනය



***දේශපාලන න්‍යාය පත්‍රය බලය බෙදීම අහෝසි කරයි***

දේශපාලන න්‍යාය පත්‍රයට අනුකූල වන සේ පළාත් සභා ඒවායේ කාලය සම්පූර්ණ වීමට පෙර විසිරුවා හැරීම මගින් යහ පාලනයේ මූලධර්ම දුර්වල වී ඇති අයුරු පෙනේ. බලය බෙදා හැරීම හා ජනවාර්ගික අර්බුදයට පිළියමක් සේ පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙන ලදි. මේ ක්‍රමය වත්මන් රජය විසින් අවධාරණයට ලක් කර ඇති අතර උතුරු නැගෙනහිර ඇතුළු සියලුම පළාත්වල මේ ක්‍රමය ස්ථාපනය කිරීමට රජය පොරොන්දු වී ඇත. එහෙත් වචන හා ඒවා ක්‍රියාවට නැංවීම අතර විශාල හිඩැසක් පවතියි.

මධ්‍යම හා වයඹ පළාත් සභා මැතිවරණ පෙබරවාරි මස 14 වැනිදා පැවැත්වුනු අතර මෙහි ප්‍රධානත ම මාතෘකාව වූයේ යුද්ධයයි. පාලක පක්ෂය විසින් රජයේ හමුදා එල්ටීටීඊ සංවිධානය අතර ඇති වන ගැටුම් දේශපාලන වේදිකාවේ දී වාසි දායක සේ යොදා ගනු දක්නට විය. පළාත් සභා මැතිවරණයක දී පළාත් මට්ටමින් පවතින ගැටලුවලට මුල් තැනක් නොදෙමින් සමස්ත දිවයිනට ම බලපාන ගැටලුවලට මුල් තැනක් දීම කණගාටුදායක තත්වයකි. මෙහිදී පළාත් සභා මූලිකව ම පිහිටුවන ලද අරමුණ අමතක කර දමා ඇති ආකාරයක් පෙනේ. මෙම තත්වය විශේෂයෙන් ම රජය මගින් පාලනය කරනු ලබන මාධ්‍යවල ද දක්නට විය. විපක්ෂ දේශපාලන පක්ෂවලට ද මෙයට ප්‍රතිචාර දැක්වීමට සිදු විය.

මෑතක දී පැවැති පළාත් සභා මැතිවරණ වේදිකාවල යුද්ධය මෙන්ම තවත් ජනප්‍රිය මාතෘකාවක් බවට පත් ව තිබුණේ උතුරු පළාතේ පැන නැගී ඇති මානුෂික අර්බුදයයි. මෙය පළාත් සභා මට්ටමමින් මෙන් ම මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ද දුර්වලතාවක් සේ හැඳින්විය හැකි වේ. නැගෙනහිර පළාත් සභාවට අලුතින් තේරී පත් වූ මහ ඇමති වරයා, සීමිත ආර්ථික සම්පත් නිසා සිය තීරණ ගැනීමේ හැකියාවට බාධා පැමිණ ඇති බවට කිහිප වතාවක් ම පැමිණිලි කර ඇත. මෙහි දී ප්‍රධානත ම ගැටලුව වී ඇත්තේ ප්‍රාදේශීය පාලනයන්ට එරෙහිව හා යුද්ධය නිසා රට පුරා සිදු වන මානව හිමිකම් උල්ලංඝනවලට එරෙහිව මහජන හඬ නැගීමක් නොපැවතීමයි.

ජාතික අයවැය ලේඛනයෙන් ප්‍රාදේශීය සභා වෙනුවෙන් වෙන් වී ඇත්තේ 5% වඩා අඩු ප්‍රමාණයකි.

දිගින් දිගට ම සිදු වන අවතැන් වූවන්ගේ හා සිවිල් වැසියන් ගේ මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව සලකා බලන විට එල්ටීටීඊය බැහැර කිරීම හා යුද්ධයෙන් ගැටලු විසඳීම කළ නොහැකි බව පෙනී යයි. පරාජය පෙනි පෙනී සිටියත් එල්ටීටීඊ සංවිධානය ප්‍රබල සතුරෙක් බව පෙනී යන්නේ කොළඹට එල්ල කළ අනපේක්ෂිත ගුවන් ප්‍රහාරයෙනි. එල්ටීටීඊ සාමාජිකයන් බවට සැක කෙරෙන පිරිසක් නැගෙනහිර පළාතේ සිංහල ගම්මානයකට පහර දී දරුවන් ඇතුළු 20 කට අධික සිවිල් වැසියන් සංඛ්‍යාවක් ඝාතනය කර ඇත. දැනට පවතින හමුදාමය ක්‍රියාමාර්ගය මගින් වර්තමානයේ හෝ අනාගතයේ සාමයක් අපේක්ෂා කළ හැකි නොවේ. රජය මෙන් ම සමාජය ද ත්‍රස්තවාදයේ දේශපාලන මූලාශ්‍ර හඳුනාගත යුතු අතර එම ගැටලුවට යහපාලනය, ප්‍රාදේශීය ස්වයං පාලනය හා මානව හිමිකම් සුරැකීම මගින් විසඳුම් සැපයීම වැදගත් ය.

## ආරක්ෂක තත්ත්වය



දෙපාර්ශ්වයේ ගැටුම්වලට මැදිව සිටින සිවිල් වැසියන් ඉවත් කිරීමට නියම කර තිබූ කාල සීමාව අවසන් ව ඇති අතර සිවිල් වැසියන් දෙපසින් මැදි කරගනිමින් දිගින් දිගටම ගැටුම් ඇති වීම සිදුවේ. දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු කණ්ඩායම් නියෝජිත ආර්. සම්බන්ධන් පවසන අන්දමට 2008 වර්ෂයේ දෙසැම්බර් මස මැද භාගයේ සිට 2009 පෙබරවාරි මාසය දක්වා සිවිල් වැසියන් 2000 අධික ප්‍රමාණයක් මරුමුවට පත් වී 4500 අධික ප්‍රමාණයක් තුවාල ලබා ඇති අතර 35000 කට අධික ප්‍රමාණයක් අවතැන් වී ඇත. දශක තුනක් තිස්සේ පවතින යුද්ධයේ අවසාන සටනේ දී එල්ටීටීඊ සංවිධානයට මෙන් ම රජයේ හමුදාවලට ද විශාල වශයෙන් හානි සිදු වී ඇත. එල්ටීටීඊයේ දරුණු ප්‍රහාර හමුවේ වුවත් එම සංවිධානයට අයත් ප්‍රදේශ හා දේපල රජයේ හමුදා විසින් අත්පත් කර ගෙන ඇති ආකාරය දක්නට වේ. නවත ම වාර්තාවලට අනුව පෙබරවාරි 25 වැනිදා වන විට එල්ටීටීඊ සංවිධානයේ බල ප්‍රදේශය වර්ග කිලෝ මීටර් 58 ප්‍රමාණයකට සීමා වී තිබිණි. මේ වන විට අඩු වෙමින් පවතින්නේ එල්ටීටීඊ සංවිධානයේ බල ප්‍රදේශ පමණක් නොවේ. ආරක්ෂක තීරු ද අඩු වෙමින් පවතියි. අම්පලවන්පොක්කනෙ බිඳ වැටීමත් සමග ශ්‍රී ලංකා යුධ හමුදාවේ 58 වන සේනාංකය මගින් පුදුකුඩුඉරිප්පු බටහිර ප්‍රදේශය අත්පත් කර ගන්නා ලදි. අම්පලවන්පොක්කනෙ, පුදුකුඩුඉරිප්පු උතුරු ප්‍රදේශයේ ඇති වැදගත් එල්ටීටීඊ මර්මස්ථානයක් සේ හැඳින්විණි. එල්ටීටීඊයේ බෝම්බ කම්හලක් (මෙහි අරුල් බෝම්බ නිපදවීම සිදු විය.) සබ්මැරීනයකට සමාන දිය යටින් යා හැකි යාත්‍රාවක් හා තවත් කුඩා දිය යටින් යා හැකි යාත්‍රා තුනක් හමුදා විසින් මෙසේ අත්පත් කර ගනු ලැබූ මුලතිව් දිස්ත්‍රික්කයේ උදයකට්ටුකුලම් ප්‍රදේශයෙන් සොයා ගනු ලැබිණි. එසේ ම එල්ටීටීඊයේ ගුවන් යානා කම්හලක් හා එල්ටීටීඊ නායකයින්ට ආරක්ෂාව සපයන රාධා බලකායේ මූලස්ථානය ද රජයේ හමුදා යටතට පත් විය. විශ්වමඩු බටහිර ප්‍රදේශයෙන් එල්ටීටීයේ වධකාගාරයක් හා විශාල බිම් ප්‍රදේශයක් පුරා පැතිරී තිබූ විවෘත සිර කඳවුරක් සොයා ගනු ලැබිණි. ජනවාරි මාසයේ අග භාගයේ දී වැදගත් එල්ටීටීඊ මර්මස්ථානයක් වන විශ්වමඩු මන්සන්ධියට ළඟා වීමට රජයේ හමුදා සමත් වී තිබිණි. මෙහි දී මරාගෙන මැරෙන එල්ටීටීඊ සාමාජිකයන් පුහුණු කරන විශාලත ම කඳවුර අත්පත් කර ගැණිනි. පුදුකුඩුඉරිප්පු උතුරු ප්‍රදේශය බලා යමින් සිටින ආරක්ෂක හමුදාවලට එල්ටීටීඊය විසින් තනා තිබූ පස් බැමි හයක් හමු වූ අතර බිම් බෝම්බ වළලා තිබූ ප්‍රදේශයකින් ද ඔවුන්ගේ ගමනට අභියෝග එල්ල විය. එසේම හමුදා සාමාජිකයන් අට දෙනෙකුට තුවාල සිදු කරමින් මරාගෙන මැරෙන එල්ටීටීඊ සමාජිකයෙක් ප්‍රහාරයක් එල්ල කළේය.

නිල නොවන ආරංචි මාර්ගවලට අනුව එල්ටීටීඊ සංවිධාන දරුණු ලෙස තුවාල ලැබූ සිවිල් වැසියන් මරාගෙන මැරෙන බෝම්බකරුවන් සේ උපයෝගී කර ගනියි. අවතැන්වූවන් සමග විශ්-වමඩු හි සුගන්දම්පුරම් වෙත පැමිණි 13 හැවිරිදි දූරියක් 30 දෙනෙකුට මරු කැඳවමින් මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කර ඇත. මෙහි දී හමුදා සාමාජිකයන් 20 හා සිවිල් වැසියන් 10 මරුමුවට පත් වූ අතර 64 කට තුවාල සිදු විය. බාහිර තුවාල කිසිවක් නොමැතිව ආරක්ෂක අංශ සාමාජිකයින් මිය යාමෙන් පෙනී යන්නේ එල්ටීටීඊ සංවිධානය රසායනික අවි භාවිත කරන බවයි. කෙසේ වෙතත් මෙය නිල වශයෙන් තහවුරු කර නොමැත. නිදහස් උළෙල සැමරීමෙන් පසු ඒ ආසන්න කාලයේ දී ම අවසාන මුහුදු කොටි මූලස්ථානය වන චලෙයි අත්පත් කර ගැනීමට රජයේ හමුදා සමත් විය. මේ නිසා මුහුදු ප්‍රදේශ ගොඩබිම් ප්‍රදේශවලින් වෙන් වීම සිදු විය. චලෙයි ප්‍රදේශය උපාය මාර්ගික ලෙස වැදගත් වනුයේ ජනතාව පදිංචිව සිටින ප්‍රදේශයක් නොවන මෙහි මුහුදු වෙරළ හා සම්බන්ධවන වන රොදකින් හා ඒ හා යා වන කළපුවකින් යුතු වන බැවිනි. එල්ටීටීඊ සංවිධානය විසින් රජයේ නාවික හමුදාවට දරුණු ප්‍රහාර කිහිපයක් එල්ල කළේ මේ ප්‍රදේශයේ සිට බව කියවේ.

දැනට එල්ටීටීඊ බල ප්‍රදේශයට විවිධ සේනාංක පහක් මගින් පස් දිශාවකින් ප්‍රහාර එල්ල වෙමින් පවතියි. 53 වන සේනාංකය, 55 වන සේනාංකය, 58 වන සේනාංකාය හා විශේෂ කාර්ය බලකාය 2 හා 4 මේ කණ්ඩායම් වේ. එල්ටීටීඊ සංවිධානයේ බලය අඩු වෙමින් පවතිද්දී ශ්‍රී ලංකා රජය විසින් දෙවන පෙළ ආරක්ෂක බලකායක් මගින් ආරක්ෂාව තර කිරීමට පියවර ගෙන ඇත. IV වන ඊළාම් යුද්ධයේ අවසාන සටනේ දී දශක තුනක් මුළුල්ලේ පැවති සිවිල් යුද්ධය අවසන් කරමින් 53 වන සේනාකංය හා 58 වන සේනාංකය සටන් වදිනු ඇති බවට අපේක්ෂා කෙරේ.

රජයේ හමුදා මගින් එල්ටීටීඊ සංවිධානයට අයත් ගුවන් පථ හතක් සොයාගනු ලැබුවද ගුවන් යානා සොයා ගැනීමට ඔවුන්ට හැකියාවක් ලැබී නොමැත. මේ අතර කොටි ගරිල්ලන් විසින් පළමු මරාගෙන මැරෙන ගුවන් ප්‍රහාරය එල්ල කරන ලදි. මෙයින් දෙදෙනෙක් මරුමුවට පත් වූ අතර 50 කට අධික පිරිසක් තුවාල ලැබීය. ආර්ථික මර්මස්ථාන හා ප්‍රභූවරුන් ඉලක්ක කරගෙන දියත් වූ මේ ප්‍රහාරය රජයේ හමුදාවල ප්‍රති ප්‍රහාර නිසා ව්‍යර්ථ විය. මෙය එල්ටීටීඊ සංවිධානයේ නමවන ගුවන් ප්‍රහාරය සේ හැඳින්විය හැකිය. මේ සංවිධානය මගින් පළමු වරට ගුවන් ප්‍රහාරයක් එල්ල කරන ලද්දේ 2007 මාර්තු 26 වන දින කටුනායක දීය. අම්පාර දිස්ත්‍රික්කයේ ඉඟිනියාගල කරමැටිය ගම්මානය කඩා වැදුනු එල්ටීටීඊ සාමාජියකයන් බවට සැක කෙරෙන පිරිසක් ගම්වැසියන් 21 දෙනෙක් ඝාතනය කර තිබිණි.

සිවිල් ජනතාවට සිදු වන තුවාල හමුවේ වුවද ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම සඳහා ශ්‍රී ලංකා රජය දිගින් දිගටම හමුදා මෙහෙයුම් සිදු කරමින් සිටියි. විවිධ අංශවල බලපෑම නිසා ජනාධිපතිවරයා විසින් ජනවාරි 29 වන දින පැය 48 ක සහන කාලයක් ප්‍රකාශයට පත් කරන ලද අතර පසුව එල්ටීටීඊ සංවිධානයේ යහපත් ප්‍රතිචාර අපේක්ෂාවෙන්, පසුව එය තව පැය 48ක් දක්වා දීර්ඝ කෙරිණි. ආරක්ෂක කලාපයේ සිටින සිවිල් වැසියන් ඉලක්ක කර ගැනීම සම්බන්ධයෙන් රජය හා එල්ටීටීඊ සංවිධානය එකිනෙකාට චෝදනා කර ගනිමින් සිටිති. මේ අතර විවිධ පාර්ශ්ව පවසන්නේ ජනතා කැමැත්තෙන් පත් වූ රජයක් හැටියට ශ්‍රී ලංකා රජය සිවිල් වැසියන්ට සිදුවන තුවාල සිදු වීම් හා ඔවුන් ඝාතනය වීම් වැලැක්වීමට පියවර ගත යුතු බවත් ජාත්‍යන්තර යුධ නීතිය යටතේ එල්ටීටීඊ සංවිධානය සිවිල් වැසියන්ට ආරක්ෂක ප්‍රදේශ කරා පළා ඒමට ඉඩ කඩ සැපයිය යුතු බවත් ය. ආරක්ෂක අංශ විසින් සපයන ලද වාර්තාවලට අනුව එල්ටීටීඊ සංවිධානය විසින් සිවිල් වැසියන් 250000 කට අධික ප්‍රමාණයක් පළා ඒමට නොදී රඳවාගෙන සිටින අතර ඔවුන් මිනිස් පළිහක් සේ යොදා ගනිමින් සිටියි. එහෙත් එල්ටීටීඊ සංවිධානය පවසන්නේ තමා සිවිල් වැසියන් පැන යාම වැලක්වීමක් සිදු නොකළ බවයි.

ආරක්ෂක හමුදා වාර්තාවලට අනුව පෙබරවාරි 12 වැනිදා වන විට එල්ටීටීඊ සංවිධානයේ සාමාජික සංඛ්‍යාව 700 දක්වා පහත බැස තිබිණි. මේ අතරින් 250 දෙනෙකු හමුදා වෙත භාර වී ඇති අතර තවත් පිරිසක් සංවිධානය හැර යමින් සිටිති. එල්ටීටීඊ සංවිධානයේ සාමාජික සංඛ්‍යාව අඩු වෙමින් පවතින මුත් රජයේ හමුදාවල සාමාජික සංඛ්‍යාවේ එසේ අඩු වීමක් දක්නට නොලැබේ. හමුදාවට දිගින් දිගටම නව බඳවා ගැනීම් සිදු වෙමින් පවතියි. හමුදා සාමාජිකයක් විශාල සංඛ්‍යාවක් තුවාල ලබා එසේත් නැත්නම් අතුරුදන් ව සිටිති. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේවා එසේත් නැත්නම් හමුදා සාමාජිකයෙක් වේවා මේ සියලු ම දෙනා ශ්‍රී ලංකා පුරවැසියෝ වෙති.

යමක් කිසි දිනෙක නොකර සිටිනවාට වඩා පමා වී හෝ කිරීම නුවණට හුරු බව හිටපු ජනාධිපතිවරයෙකුගෙන් ලැබුණු අවවාදයකි. ශ්‍රී ලංකා රජය හා එල්ටීටීඊ සංවිධානය අතර මේ පවත්නා යුද්ධය ජනවාර්ගික අර්බුදයට විසඳුම් නො සපයයි. ශ්‍රී ලංකාවට සාමය ළඟා කර ගත හැක්කේ සාකච්ඡා මාර්ගයෙන් පමණි.

## මානව හිමිකම්

ජනවාරි මස 21 වැනිදා සිට පෙබරවාරි මස 20 වැනි දා දක්වා මානව හිමිකම් විශ්ලේෂණය




| | අත්අඩංගුවට ගැනීම් | පැහැරගෙන යාම් | අතුරුදන් වීම් | ඝාතන | තුවාල සිදු කිරීම් |
|---|---|---|---|---|---|
| කොලඹ | 8 | 2 | | 5 | 51 |
| ගම්පහ | 30 | 1 | | 1 | 2 |
| අනුරාධපුර | 2 | | | | |
| කලුතර | | | | 1 | |
| පුත්තලම | | | 1 | | |
| බදුල්ල | 2 | | | | |
| යාපනය | | | 1 | 3 | 1 |
| මාතර | | | | 1 | 4 |
| මාතලේ | | | 1 | 2 | |
| මඩකලපුව | 3 | 1 | 1 | 9 | 20 |
| ත්‍රිකුණාමලය | 11 | 1 | 1 | | |
| වවුනියාව | 126 | 2 | | 6 | 14 |
| මන්නාරම | | | 3 | 1 | |
| අම්පාර | | | | 1 | |
| මහ නුවර | 5 | | | | |
| නුවර එළිය | | | 1 | | |
| | 187 | 7 | 9 | 30 | 92 |

**මුලතිවු** (ප්‍රස්ථාරයේ සටහන් කර නොමැත.)

**ආ**රක්ෂක කලාපයේ සිදු වූ ෂෙල් ප්‍රහාර නිසා සිවිල් වැසියන් 1030 දෙනෙක් ජීවිතක්ෂකයට පැමිණ 2875කට තුවාල සිදු විය. පෙබරවාරි 10 වැනිදා සිවිල් වැසියන් 17 දෙනෙක් නාඳුනන පුද්ගලයින් විසින් වෙඩි තබා ඝාතනය කරනු ලැබිණි.

**කොළඹ**

කොළඹ නගරය හා කටුනායක ඉලක්ක කරගෙන එල්ටීටීඊ සංවිධානය මගින් සිදු කරන ලද ගුවන් ප්‍රහාරය නිසා දෙදෙනෙක් ජීවිතක්ෂයට පත් වී 50 ක් තුවාල ලැබූහ.

**මඩකලපුව**

මඩකලපුව පොලිසිය ඉදිරිපිට ඉන්ධන පිරවුම්හලක නවතා තිබූ බෝම්බ සහිත බයිසිකලයක් පෙබරවාරි 21 වන දින උදෑසන 7.30 පමණ පුපුරා යෑම නිසා දෙදෙනෙක් ජීවිතක්ෂයට පත් වී දහයකට අධික පිරිසක් තුවාල ලැබූහ. මෙහිදී පොලිස් නිලධාරියෙක් හා සිවිල් වැසියෙක් ජීවිතක්ෂයට පත් වූ අතර පොලිස් නිලධාරීන් දෙදෙනෙක්, සිසුන් හතර දෙනෙක්, ගුරුවරයෙක්, හෙදියක් හා තවත් තුවාල ලැබූ සිවිල් වැසියන් දෙදෙනෙක් රෝහල් ගත කරන ලදි. නාඳුනන තුවක්කුකරුවන් විසින් ටීඑම්වීපී සාමාජිකයන් ලුහු බඳින බවට තොරතුරු ලැබිණි.

**ත්‍රිකුණාමලය**
එල්ටීටීඊ සාමාජිකයන් බවට සැක කෙරෙන සිවිල් වැසියන් 11 දෙනෙක් අත්අඩංගුවට ගන්නා ලදි.

**වව්නියාව**
TNA වාර්තාවලට අනුව තුවාල ලැබූ 122නෙක් වන්නියේ සිට වවුනියා රෝහල වෙත පැමිණ තිබේ. මේ අය නෙලුන්කුලම් කඳවුරු වැසියෝ වූහ.
ශ්‍රී ලංකා ආරක්ෂක අංශ විසින් ඉන්දිය සන් රූපවාහිනී ජාලයේ සේවයේ නියුතු ශ්‍රීලාංකියකන් හතර දෙනෙක් අත්අඩංගුවට ගන්නා ලදි. මේ අය එල්ටීටීඊ සංවිධානය සමග සබඳතා ඇති බවට සැක කෙරණි.

එල්ටීටීඊ සාමාජිකයෙක් බවට සැක කෙරන පුද්ගලයෙක් යුධ කලාපයෙන් පිටතට සිවිල් වැසියන් ප්‍රවාහනය කරමින් තිබූ බස් රථයකට අත් බෝම්බ ප්‍රහාරයක් එල්ල කළ අතර මෙයින් එක් කාන්තාවක් මරුමුවට පත් වී 13 දෙනෙක් තුවාල ලැබීය.

**මන්නාරම**
පෙබරවාරි 5 වන දින සිට යුවලක් හා ඔවුන්ගේ තුන් මස් වියැති දරුවා අතුරුදන්ව සිටිති. දුර තොරතුරු hrdu2@cha.lk, hrac1@cha.lk වෙතින් ලබා ගත හැකි වේ.

# ආර්ථික සන්දර්භය

**මේ** මාසය තුළ ආර්ථික ක්ෂේත්‍රයේ මිශ්‍ර ප්‍රතිඵල දකින්නට හැකි විය. සියලුම නරක ප්‍රවෘත්ති ලැබුනේ බාහිර අංශයෙනි. 2007 වර්ෂයේ දී පැවති ඇඟලුම් කම්හල් 350 ප්‍රමාණයෙන් 60 ත් 70ත් අතර සංඛ්‍යාවන් වැසී ගොස් ඇති බවට වාර්තා විය. මේ අනුව පසුගිය මාස පහළොවක කාලය මුළුල්ලේ ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා ප්‍රමාණය 300,000 සිට 280,000 දක්වා අඩු වී ඇත.

ශ්‍රී ලාංකික මූල්‍යායතන අන්තර්ජාතික මූල්‍ය අර්බුදයේ ගොදුරු බවට පත් වී නැති ආකාරයක් පෙනේ. කෙසේ වෙතත් අන්තර්ජාතික මූල්‍ය අර්බුදය ශ්‍රී ලංකාවට දි විවිධ ආකාරයෙන් බලපා ඇති ආකාරය පෙනේ. වෙලඳපළ අහිමි වීම නිසා දේශීය කර්මාන්ත වෙනුවෙන් ලබා දෙන ලද ණය අය කර ගත නොහැකි තත්වයක් ඇති වී තිබේ. ණය දීමේ දී ඇපකර වශයෙන් තබා ගන්නා ලද යන්ත්‍රවලට වෙළඳ පලක් නොමැති අතර ඒ නිසා ම ණය නැවත අය කර ගැනීමේ හැකියාවක් නොමැත.

ප්‍රමාණවත් තරම් විදෙස් සංචිත ඇති බවට මහ බැංකුව දිගින් දිගට ම තහවුරු කරමින් සිටියි. 2008 වර්ෂයේ අවසානය වන විට මේ ප්‍රමාණය ඩොලර් බිලියන 1.8 ක් විය. මෙය සති හයක ආනයනයන්ට වැය වන මුදල හා සමාන මුදලක් වූ අතර නිල නොවන සංචිතවල සම්පූර්ණ ප්‍රමාණය ඩොලර් බිලියන තුනක් විය. ආනයන මිල පහත යෑම කිසියම් දුරකට මේ සම්බන්ධයෙන් යහපත් බලපෑමක් ඇති කර තිබේ. එහෙත් අපනයන ආදායම් ද පහළ යමින් පවතියි. තේ හා රබර් මිල ද පහත බැස ඇත. පසුගිය වසරේ ජනවාරි මාසය හා සසඳා බලන විට මේ වසරේ ජනවාරි මාසය වන විට සංචාරක ආගමනය 32කින් පහළ බැස ඇත. විදෙස් සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන් ආදායම ද අඩු වීමට ඉඩ තිබේ. ආසන්න ඉදිරියේ දී ඍජු විදෙස් ආයෝජන ඉහළ යනු ඇති බව සිතිය නොහැක. වාණිජ ණය ලබා ගැනීම් දුෂ්කර මෙන් ම මිල අධික වී තිබේ. මහ බැංකුව විසින් පසුගිය මාසයේ අලෙවි කිරීම ආරම්භ කළ ඩියස්පොරා බැඳුම්කර විකිනීමෙන් ඉලක්ක ගත ඩොලර් මිලියන 500 උපයා ගැනීම දුෂ්කර කාර්යයකි. මහ බැංකුව විනිමය හුවමාරුවක් සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් සිටියි. මෙහි අරමුණ වන්නේ නිසැකයෙන් ම පිළිගත නොහැකි කොන්දේසි සමග ලබා දෙන අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ සහය ලබා ගැනීමෙන් වැලකීමයි. මේ මාසය පුරාවට රුපියල් හා ඩොලර් අනුපාතිකය රුපියල් 114 සේ පවත්වාගෙන යෑමට මහ බැංකුව සමත් විය.

ෆිච් අනුපාතියන්ට අනුව ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන දේශීය හා විදේශීය විනිමය නියමිත අනුපාතිකය ස්ථාවර තත්ත්වයේ සිට ඍණාත්මක තත්වයක් දක්වා වර්ධනය වීම සිදු වූයේ විදෙස් සංචිත දුර්වල වී ඇති බැවිණි. මේ තත්වයට වගකිව නොහැකි බවට මහ බැංකුව ප්‍රසිද්ධියේ විවේචනය කර ඇත.

ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගම බිඳ වැටීමත් සමග මූල්‍ය ආයතන කෙරෙහි ජනතාව තුළ පැවති විශ්වාසය පළුදු වී තිබේ. නිල නොවන වාර්තාවලින් හෙළි වූයේ සමහර මූල්‍ය ආයතනවල තැන්පතු ක්ෂය වෙමින් ඇති බවයි. මූල්‍ය සමාගම් හා කල්බදු සමාගම්වලට ආධාර සැපයීමක් සේ මහ බැංකුව විසින් රුපියල් බිලියන 4.25 පැකේජයක් හඳුන්වා දී තිබේ. මේ පැකේජයට අනුව මෙම සමාගම්වලට සිය දේපල භාණ්ඩාගාර බිල්පත්වලට හුවමාරුකර ගැනීම සඳහා විකිණීමේ හැකියාව ඇත.

වාර්තාවන කාලය තුළ ආර්ථික වශයෙන් ඇති වූ යහපත් ප්‍රතිඵලය සේ උද්ධමනය 10.7% සිට 7.6% දක්වා පහළ බැසීමයි. මෙය පසුගිය වසර තුනක කාලය තුළ වාර්තා වූ අඩුම අගය සේ සැලකේ. ඉන්ධන මිල හා සෙසු පාරිභෝගික භාණ්ඩවල මිල පහල යෑම හා මහ බැංකුවේ දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය නිසා 2007 වර්ෂයේ දී 20% සේ පැවති ණය ප්‍රමාණය 2008 වන විට 8% දක්වා අඩු වීම ද මෙයට හේතු වූවා වන්නට ඇත. පසුගිය මාසයේ දී කිරිපිටි, ගෑස් ආදි පාරිභෝගික ද්‍රව්‍ය කිහිපයක මිල අඩු වීම සිදු විය. මෙම මිල අඩු කිරීමට රජයේ බදු ආදායම් ද හේතු විය. මෙසේ ආර්ථිකය මනා ලෙස කළමනාකරණය කිරීම මගින් සමස්ත ආර්ථික ස්ථාවරත්වය ඇති කර ගත හැකි වේ.

උද්ධමනය පහළ යෑම නිසා ණය පාලනය කිසියම් දුරකට ලිහිල් කිරිමට මහ බැංකුවට හැකි වී තිබේ. පොලී අනුපාතිකයන් අඩු කිරීම වෙනුවෙන් Reverse Repo අනුපාතිකය 10% සිට 9.5% දක්වා අඩු කර තිබේ. එසේම වානිජ බැංකු සඳහා වන රජ්‍ය සංචිතයෙන් ප්‍රමාණය 7% කින් එනම් රුපියප් බිලියන 9ක නිදහස් කිරීම දැකිය හැකි විය.

ඍබරවාරි මාසය තුළ ව්‍යාපාර පිළිබඳ විශ්වාසය පළ කිරීම ඉහල මට්ටමක පැවතිණි. කෙසේ වෙතත් මේ මාසය තුළ කොළඹ සියලු කොටස් මිල දර්ශකය 7% පමණ පහත වැටිණි.

# පරිසරය

**ජ**නවාරි 30 වන දින ඩයලොග් සමාගම හා ශ්‍රී ලංකා අපදා කළමණාකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධව හදිසි ආපදා අනතුරු ඇඟවීමේ ජාලයක් ස්ථාපනය කරන ලදි. හදිසි අපාදාවක් ඇති වන අවස්ථාව දී ඒ සම්බන්ධයෙන් දැනට පවතින ජංගම දුරකථන ජාලය ඔස්සේ කෙටි පණිවඩ මගින් රට වටා සිටින ජනතාවට දැනුම් දීමක් සිදු කෙරෙනු ඇත. සාමාන්‍ය ජනතාවට දැනුම් දීමට පෙර මෙහි පළමු පියවර සේ මේ ජාලය මගින් එයට සම්බන්ධ අංශ සමග සන්නිවේදනය කරමින් ඒ බව තහවුරු කර ගැනෙනු ඇත.

දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ විවිධ කර්මාන්ත පහක් අරමුණු කර ගනිමින් පාරිසරික වශයෙන් තිරසාර කර්මාන්ත බිහි කිරීම සඳහා ශ්‍රී ලංකා වානිජ හා කර්මාන්ත මණ්ඩලය (FCCISL) වැඩ පිළිවෙලක් ආරම්භ කර තිබේ. මෙමෙ වැඩසටහන මගින් පරිසර හිතකාමී ආකෘතියක් හඳුන්වා දෙනු ඇති අතර එමගින් පරිසර දූෂණය වලක්වා කර්මාන්ත පවත්වාගෙන යෑමට ඉඩකඩ සළසනු ඇති බව අපේක්ෂා කෙරේ. පොලොන්නරුවේ බිත්තර වී ව්‍යාපෘතිය, මාතලේ දිස්ත්‍රික්කයේ හුණු ගල් කර්මාන්තය, වයඹ පළාතේ කැපූ පොල් කර්මාන්තය, නැගෙනහිර හා උතුරු මැද පළාත්වල වී මෝල් කර්මාන්තය හා දිවයින පුරා ඉන්ධන පිරවුම්හල් සේවාව මේ කර්මාන්තවලට අයත් වේ.

එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සිට අභ්‍යන්තර අවතැන්වූවන් දිගින් දිගටම රජයේ පාලන ප්‍රදේශවලට පැමිණීම සිදු වෙමින් තිබේ. රජය ඔවුන්ට සුදුසු නවාතැන් සැපයීමේ කාර්යයේ යෙදී සිටිති. මේ නිසා වනාන්තර එළි කිරීම, භූමි ප්‍රමාණයට වඩා වැඩිපුර භාවිත කිරීම හා අපවහන කටයුතු නිසා විවිධ පාරිසරික ගැටලු ඇති වෙමින් පවතියි. ජලය මගින් පැතිරෙන රෝග වැලැක්වීම සඳහා ආරක්ෂිත ජල පහසුකම් සැපයීම ප්‍රමුඛතාවක් බවට පත් වී තිබේ. පළා එන පුද්ගලයන් විවිධ ලෙඩ රෝගවලට ලක් වී සිටීම, අර්බුද නිසා දැඩි මානසික ආතතියකින් සිටීම හා විශාල සංඛ්‍යාවක් සීමිත ඉඩක ජීවත් වීම යන සාධක රෝග පැතිරී යාමට උපකාර වේ. මේ පුද්ගලයන් නැවත පදිංචි කරවීම බොහෝ දුෂ්කර කාර්යයක් වන්නේ යුද්ධය තව මාස ගණනක් එසේත් නැත්නම් අවුරුදු ගණනාවක් පුරාවට සිදු වීමට ඉඩ ඇති අතර මේ ප්‍රදේශවල තත්වය සාමාන්‍ය අතට හැරීමට දිගු කාලයක් ගත වනු ඇති නිසාය. අභ්‍යන්තර අවතැන් වූවන් කඳවුරුවල සිටින කාලය දිගු වත් ම පාරිසරික ගැටලු ඇති වීමේ හැකියාව ද ඉහළ යනු ඇත.

# සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය

**පෙ**බරවාරි මාසය තුළ සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය සම්බන්ධයෙන් අදහස් පළ කිරීම හේතු දෙකක් නිසා දුෂ්කර වේ. එනම් මාධ්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී පැන නගින උස් මිටි තැන් වලක්වා ගත යුතු වීම හා සිවිල් සමාජය ගැඹුරු නින්දකට වැටීම දක්නට ලැබෙන බැවිනි.

උතුරු ප්‍රදේශයේ සිදුවන යුද්ධය දිගින් දිගටම

සියලු මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යවල ප්‍රධාන පුවත බවට පත් වනු දැකිය හැකි විය. ශ්‍රී ලංකා රජය හා එල්ටීටීඊ සංවිධානය අතර පවතින පරස්පර විරෝධී මත නිසා පීඩාවට පත්ව සිටින්නේ මේ දෙපිරිසට මැදි වී සිටින සිවිල් වැසියන්ය. ස්වාධීන අන්තර්ජාතික නිරීක්ෂකයන් පවසන අන්දමට එල්ටීටීඊ සංවිධානය ගැටුම් පවතින ප්‍රදේශවල සිට පළා එන සිවිල් ජනතාව උවමනාවෙන් ම වැලක්වීම සිදු කරයි. මෙය අනවශ්‍ය ලෙස හා නීති විරෝධී ලෙස ඔවුන්ගේ ජීවිත අනතුරේ දැමීමක් සේ සැලකිය හැකිය. රජයේ හමුදා ප්‍රහාරයන් හමුවේ පසුබසින එල්ටීටීඊ සංවිධානය සිවිල් වැසියන් ද තමා සමග පසුබසිනු ඇතැයි බලාපොරොත්තු වෙති. මෙයින් සිදු වන්නේ ඔවුන් අවදානම කරා යොමු කරවීමක් පමණක් නොවන අතර ඔවුන් ම මානුෂීය ආධාරවලින් ඈත් කිරීමකි. එල්ටීටීඊ සංවිධානයේ බල ප්‍රදේශය අඩු වත් ම ප්‍රදේශයේ ජන ඝනත්වය වැඩි වීම නිසා සිවිල් වැසියන් තුවාල ලැබීමේ අවදානම ද වැඩි වේ. මෙය ඔවුන්ගේ

ජීවිතයට තර්ජනාත්මක තත්ත්වයකි.*

අන්තර්ජාතික ප්‍රජාවන් විසින් නිකුත් කරනු ලැබූ අභියාචනවලින් ඉංග්‍රීසි හා සිංහල පුවත්පත් පිරී පැවතිණි. කෙසේ වෙතත් සිංහල පුවත්පත්වල දී විපතට ලක්ව සිටින දෙමළ ජනතාව පිළිබඳ පුවත් අභිබවමින් ප්‍රාදේශීය සභා මැතිවරණය පිළිබඳ පුවත් ඉස්මතු වී තිබෙනු දැකිය හැකිය. කෙසේ වෙතත් එය සිතා මතා කළ දෙයක් නොවේ. සමහර විට එය සංවේදීකම අඩු වීම නිසා සිදු වූවා වන්නට පුළුවන. මෙය හුදෙක් විශ්වාසයක් පමණි.

දෙවනුව නිරීක්ෂණය කෙරුණු කාරණය වන්නේ අනාගතයට එබී බැලීමකි. මෙයට අනුව 'එක්සත් ජනතා නිදහස් සන්ධානය සිංහල බෞද්ධ පරමාදර්ශයක් සේ දිගටම පවතිනු ඇත....' එසේම එක්සත් ජනතා නිදහස් සංධානය ළඟ ඔල බස්නාහිර පළාත් මැතිවරණයේ දී කොළඹ, බේරුවල හා මීගමුව වැනි ඡන්ද කොට්ඨාශවල පවා මේ මතය ප්‍රතිසන්ධානගත කර තිබීමක් දැකිය හැකි නොවේ. මෙම කතු වැකිය උපුටා දැක්වීම සිදු කරන්නේ හුදෙක් දේශපාලන අරමණක් සඳහා නොවේ. එය සිදු කරන්නේ එහි සොයුරු පුවත්පතවන ලංකාදීප පුවත්පතේ එම දිනයේ ම (16 වැනිදා) කතුවැකිය හා සන්සන්දනය කර බැලීමටය. ලංකාදීප කතුවැකියේ දී ඡන්ද මධ්‍යස්ථානවලදීම ඡන්දය ගණන් කිරීම සම්බන්ධයෙන් සඳහන් කර තිබේ. මෙහි කොළඹ විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික අධ්‍යයන පිළිබඳ අධ්‍යයනාංශයේ ආචාර්ය W.M කරුණාදාස විසින් සිදු කර ඇති වයඹ හා මධ්‍යම මැතිවරණ විශ්ලේෂණයක් දක්වා ඇත. බැරක් ඔබාමා විසින් ලබා ගත් ප්‍රතිඵල හා සන්සන්දනය කරමින් මේ උගත් ආචාර්යවරයා රසවත් නිරීක්ෂණයක් සිදු කරයි. මේ දක්වා අපට සිටියේ දුර්වල රජයක් හා ප්‍රබල විපක්ෂයකි. එහෙත් නව ප්‍රවණතාව වන්නේ ප්‍රබල රජයක් හා දුර්වල විපක්ෂයක් බිහි වීමයි. රටකට අවශ්‍යවන්නේ ද මෙයයි. මේ රටට අවශ්‍යවන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ සිටින ඒකාධිපතියෙකි. ඒකාධිපතියෙක් යනුවෙන් අදහස් වන්නේ පැකිලීමකින් තොරව තීරණ ගත හැකි පුද්ගලයෙකි. කලින් පැවසූ ආකාරයට ම සිවිල් සමාජය ඇත්තෙන් ම ගැඹුරු නින්දකට වැටී ඇති බව පෙනේ.

* ආචාර්ය ඇනා නෙයිස්ටාට් ගේ HRW වාර්තාව 2009 පෙබරවාරි 24

# මානුෂීය හා සංවර්ධන අවකාශය

උතුරේ ගැටුම්කාරී තත්වය වැඩි දියුණු වීමත් එල්ටීටීඊ සංවිධානයේ බලය ක්ෂය වී යෑම සිදුවේ. ICRC විසින් ජනවාරි මස නිකුත් කරන ලද පුවත් අනාවරණ මගින් පෙනී යන්නේ සිවිල් වැසියන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු වී ඇති ආකාරයයි. එසේම වෛද්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීම හා අවශ්‍යතා ඉටු කිරීමට තරම් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටීම යන කාරණය ද අවධාරණය වී ඇත. සිවිල් වැසියන්ට ආරක්ෂිත සංචලන පහසුකම් ලබා දෙන ලෙස ඔවුන් ශ්‍රී ලංකා රජයෙන් මෙන් ම එල්ටීටීඊ සංවිධානයෙන් ද ආයාචනා කර සිටිති.ක්ස් හා සෙසු සංවිධාන විසින් ද මේ හා සමාන කරුණු සම්බන්ධයෙන් ගැටලු මතු කර ඇති අතර ඔවුන් රජයෙන් ඉල්ලා සිටින්නේ අර්බුද පවතින ප්‍රදේශවල සිට පලා එන ජනතාව අන්තර්ජාතික සම්මතයන්ට අනුව පිළිගන්නා ලෙසයි.

සාම ක්‍රියාවලියේ සම සමාජිකයන් වන නොර්වේ එක්සත් ජනපදය, ජපානය හා යුරෝපා සංගමය මේ දරුණු තත්වය අඩු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සමග සාකච්ඡා කරන ලෙස එල්ටීටීඊ සංවිධානයෙන් ඉල්ලා සිටියි. රජය පාර්ශ්වයෙන් සමාව දීමක් ප්‍රතික්ෂේප කරනු ලැබූ අතර කොන්දේසි විරහිරතව අවි බිම තබා යටත් වන ලෙසට ඉල්ලීමක් කෙරිණි.

අභ්‍යන්තර අවතැන් වූවන් පාසැල, කාර්මික විද්‍යාල හා විශ්වවිද්‍යාල ගොඩනැගිලි ආදී වව්නියාවේ ස්ථාන දහ තුනක ද යාපනයේ ස්ථාන හතරක ද මන්නාරමේ ස්ථාන තුනක ද රඳවා ඇත. මේ සියලු අභ්‍යන්තර අවතැන් වූවන්ට යළි පදිංචි කිරීමේ අමාත්‍යංශය යටතේ දිස්ත්‍රික් ලේකම් හරහා පිසූ ආහාර ලබා දෙනු ලැබේ.
පහත දැක්වෙන එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනවල ප්‍රධානත්වයෙන් කාර්ය බලකායන් තුනක් ස්ථාපනය කර ඇත.

1. නිවාස -NFRI - UNCHR
2. සෞඛ්‍ය, අධ්‍යාපනය- WATSAN UNICEF
3. ආහාර -WFP

අක්කර 300 බැගින් වූ සහන ගම්මාන තුනක් ස්ථාපනය කිරිම සඳහා ශ්‍රී ලංකා රජය කටයුතු කරමින් සිටියි. වව්නියාවේ හා මන්නාරමේ අක්කර 1000 ප්‍රමාණයක් මේ වෙනුවෙන් එළි කිරීම සඳහා වෙන් කර ඇත.

අවතැන් වූවන්ගේ සුභසාධනය සැදීමේ හා සෙසු අවශ්‍යතා සැපයීමේ වගකීම රජය විසින් භාරගෙන ඇත. මේ ප්‍රදේශවල කටයුතු සිදු කරන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන වලට අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලෙස යලි පදිංචි කරවීමේ අමාත්‍යංශය විසින් ඉල්ලීම් සිදු කර ඇත. යලි පදිංචි කරවීමේ අමාත්‍යාංශය හා සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලෙස ඉල්ලමින් රාජ්‍ය නොවන සංවිධාන වෙත ලිපි යවා ඇත. ඒ අනුව මෙම ප්‍රදේශවල කටයුතු කිරීමට ඉඩකඩ ලැබෙන්නේ ගිවිසුම් අත්සන් කරනු ලබන සංවිධානවලට පමණි.

පෙබරවාරි 17 වැනිදා වන විට පවුල් 7832කට අයත් පුද්ගලයින් 30517ක් සුභසාධන මධ්‍යස්ථාන 13ක සිටි අතර UNHCR හා ICRC සංවිධානවලට මේ අවතැන් වූවන්ගේ කඳවුරුවලට ළඟා වීමේ හැකියාව පවතියි. එහෙත් ඔමින්තෙයි හි පිටවීමේ/පිවිසුම් ස්ථානවලට ළඟ වීමට මේ සංවිධානවලට අවස්ථාව ලබා දී නොමැත. UNHCR මේ ලියාපදිංචි කරවීමේ ස්ථානවලට තමාට ළඟා වීමට අවස්ථාව දෙන මෙන් ඉල්ලීම් කරමින් සිටයි. එසේම ඔවුන් පෙන්වා දෙන්නේ ආරක්ෂක නිලධාරීන් කඳවුරු තුළ නොව කඳවුරුවලින් පිටත සිටිය යුතු බවයි. එසේම කඳවුරු පරිපාලනය සිවිල් අධිකාරීන් යටතට පත් කල යුතු බව ද ඔවුහු පවසා සිටිති.

ICRC මගින් පෙබරවාරි 10 සිට 20 දක්වා කාලය තුළ තුවාල ලැබූවන් 1212 දෙනෙක් මුහුදු මාර්ගවලින් මුලතිව් හි ත්‍රිකුණාමල රෝහලට හා සෙසු රෝහල්වලට රැගෙන ඒම සිදු කර ඇත.

ගොඩබිම් මාර්ගවලින් ආහාර ප්‍රවාහනය කිරිම දුෂ්කර වී ඇති හෙයින් ICRC ධජය සහිත බෝට්ටු මගින් පුදුමාතලන් ප්‍රදේශයට මිශ්‍ර ආහාර සළාක යැවීමට පියවර ගෙන තිබේ. මෙය පෙබරවාරි 10 වැනිදා ආරම්භ කරන ලද අතර මුදා නොගත් ප්‍රදේශවලට යවන ලද බෝට්ටු හතරක් මගින් තුවාල ලැබූවන් ත්‍රිකුණාමල රෝහල කරා ගෙන ඒම සිදු විය.

මුලතිව් හි පිවිසුම් කඳවුරක දී මරාගෙන මැරෙන බෝම්බකාරියක් විසින් බෝම්බයක් පුපුරුවා ගන්නා ලද අතර මෙයින් ඇය ඇතුළු 30 දෙනෙක් මරුමුවට පත් විය. මෙයට ආරක්ෂක අංශ සාමාජිකයින් 20 දෙනෙක් ඇතුළත් වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රමුඛ සෙසු සංවිධාන මගින් මෙම ප්‍රහාරය හෙලා දකිනු ලැබූ අතර සිවිල් වැසියන් ප්‍රහාර සඳහා ඉලක්ක කර නොගන්නා ලෙස එල්ටීටීඊ සංවිධානයෙන් ඉල්ලීම් කෙරිණි. UNCHR හා ICRC එකට එක් ව පවුල්වලින් මග හැරී ගිය පුද්ගලයන් සොයා ගැනීමට උපකාර කෙරේ. ICRC හා SLRCS එක්ව වන්නි ප්‍රදේශය ඇතුළත සිටින පවුලේ සාමාජිකයන් හා වන්නි ප්‍රදේශයෙන් පිටත සිටින සාමාජිකයන් ආරක්ෂිතව එක් කිරීමේ යෙදී සිටියි.

එත්සත් ජාතීන්ගේ මහලේකම් යටතේ වන මානුෂීය කටයුතු හා සහන සේවා පිළිබඳ සම්බන්ධීකාරක ජෝන් හෝම්ස් මහතා පෙබරවාරි 19 වන දින, දින තුනක සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය. රට තුළ පවතින මානුෂීය තත්වය පිළිබඳ සොයා බැලීම හා ආහාර ද්‍රව්‍ය හා වෛද්‍ය පහසුකම් නොමැතිව සිරවී සිටින සිවිල් වැසියන්ගේ තත්වය සොයා බැලීම ඔහුගේ සංචාරයේ අරමුණ වී ඇත. ඔහු ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක, ආරක්ෂක ලේකම් හා විදේශ කටයුතු පිළිබඳ මෙන් ම ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යවරු හමුවිය. මෙහිදී ගැටුම් පවතින ප්‍රදේශවල සිට රජයේ පාලන ප්‍රදේශ වෙත පැමිණෙන සිවිල් ජනතාව අන්තර්ජාතික සම්මතයන් යටතේ පිළි ගත යුතු බව අවධාරණය කෙරුණු අතර සිවිල් වැසියන්ට තමාට අභිමත ප්‍රදේශවලට යාමට ඉඩකඩ සළසා දෙන ලෙස එල්ටීටීඊ සංවිධානයෙන් ඉල්ලා සිටිනු ලැබිණි.

ජෝන් හෝම්ස් මහතා හා ජනාධිපතිවරයා අතර හමුවක් සිදු වූ අතර මෙහි දී ගැටුම් පවතින ප්‍රදේශයෙන් සිට පළා එන සිවිල් වැසියන් සම්බන්ධයෙන් හා ඔවුන්ට අවශ්‍ය ආහාර හා ඖෂධ වැඩි ප්‍රමාණයන්ගෙන් ලබා දීම පිළිබඳ සාකච්ඡා විය. එසේම ගැටුම්වලට මැදි වී සිටින සිවිල් වැසියන් වෙත ආහාර හා ඖෂධ යැවීම සම්බන්ධයෙන් ද මෙහි දී සාකච්ඡා විය.

ජෝන් හෝම්ස් මහතා, මෑතක දී අභ්‍යන්තර අවතැන් වූවන් 30,000 ප්‍රමාණයක් පැමිණ සිටින වව්නියාවට ගොස් එක්සත් ජාතීන්ගේ සංවිධානය හා රාජ්‍ය නොවන සංවිධාන එක් ව මේ අවතැන් වූවන්ට සේවා සපයන අයුරු නිරීක්ෂණය කළේය. මෙහි දී පවතින ප්‍රධානතම අභියෝගය වන්නේ අවතැන් වූවන් ලියාපදිංචි

කරවීමේ කාර්යය විනිවිද පෙනෙන සුළු ආකාරයෙන් සිදු කිරීමයි. එසේ ම පවුල් නැවත එක් කිරීම, වඩාත් නිදහසේ සංචලනය කිරීමේ හැකියාව ලබා දීම හා කඳවුරු සිවිල් පරිපාලනයක් යටතට පත් කිරීම ද අභියෝග සේ පවතියි.

මෙසේ පළා එන පුද්ගලයන්ගේ හදිසි අවශ්‍යතාවන් වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 10 ලබා දීමට සහන සේවා පිළිබඳ සම්බන්ධීකාරක එකඟ වී ඇත.

**නැගෙනහිර**
**මඩකලපුව**
මඩකලපුවේ ප්‍රදේශ සඳහා නැවත පදිංචි කරවීමේ වැඩසටහන සූදානම් වී තිබේ. තොප්පිගල බිම්බෝම්බ ඉවත් කිරිමේ කටයුතු සිදු කර ඇති අතර අඩු අවදානම් කලාපයක් වන බවට සහතිකයක් නිකුත් කර තිබේ. මෙහි ගොස් නිරීක්ෂණය කිරීමේ සැලසුම් සකස් කර ඇතත් ඒ සඳහා ආරක්ෂක අංශවල අවසරය ලබා ගත යුතු වේ. කැලෑ ප්‍රදේශ එළි කිරීම සඳහා සේවකයන් නොමැති වීම නිසා වෙන්කලාඩි හි ඉරල්කුලම් හි නැවත පදිංචි කරවීමේ වැඩසටහන් පමා වී තිබේ.

**ත්‍රිකුණාමලය**
ඉල්ලාවලෙෙ හා නවරත්නපුරම් හා පවුල් 240 නැවත පදිංචි කරවා තිබේ. මේ පවුල්වලට නිවාස සෑදිමට ආයතනයක් එකඟ වී සිටියි. නැවත පදිංචි කරවන පවුල් වෙනුවෙන් නැවත පදිංචි කරවනු ලබන ප්‍රදේශවල නිවාස 1400 පමණ ප්‍රමාණයක් ගොඩනැගිය යුතු වේ. මෙම නිවාස තැනීම සඳහා තවම අනුග්‍රාහකයෙක් ඉදිරිපත් වී නොමැත.

**පොදු කරුණු**
ලෝක බැංකුව විසින් පෝෂණය සඳහා වන තරගකාරී සංවර්ධන වෙළඳපළක් ස්ථාපනය කර තිබේ. මෙහි අරමුණ වන්නේ දකුණු ආසිය-ාවේ ගැබිණි මාතාවන්, ළදරුවන් හා දරුවන් ගේ ජීවිත පෝෂණීය ලෙස වෙනස් කිරීම සඳහා නිර්මාණාත්මක අදහස් සොයා ගැනීම හා ඒවාට මුදල් සොයා ගැනීමයි. මෑතක දී සිදු කරන ලද ජනගහන හා සෞඛ්‍ය සමීක්ෂණයකින් පෙනී ගියේ අවුරුදු පහකට අඩු දරුවන්ගෙන් 22% ප්‍රමාණයක් අඩු බර දරුවන් බවයි. එසේම 18% ප්‍රමාණයක් මිටි බවින් පෙළෙන්නෝ වන අතර 15% ප්‍රමාණයක් ප්‍රමාණයට වඩා කෙසඟය.

## බාහිර ක්‍රියාකාරීන්

මුලතිව් හි ඇති වූ තීරණාත්මක තත්වය නිසා බාහිර ක්‍රියාකාරීන්ගේ මැදිහත් වීම ඉහළ ගොස් ඇති ආකාරය පෙනේ. එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ජෝන් හෝම්ස් මහතා මෙහි පැමිණීම සිදු විය. ශ්‍රී ලංකාව වෙනුවෙන් එක්සත් රාජධානියේ විශේෂ තානාපතිවරයෙකු පත් කිරීම ගැටලුකාරී ලෙස අවසන් විය. සාම ක්‍රියාවලියේ සම සාමාජිකයන් එල්ටීටීඊ සංවිධානයෙන් යුද්ධය නවත්වන ලෙස ඉල්ලා සිටියි. ඉන්දියාවේ මතය තවමත් පැහැදිලි නැති වුවත් සටන් විරාමයක් ඇති කරන සේ ඉන්දියාව ඉල්ලා සිටියි. සමස්තයක් වශයෙන් ගත් කළ මුළු රටේම මානව හිමිකම් ගැටලුවට භාජනය වී ඇති ආකාරය පෙනේ. වව්නියාවේ ඇති වී ඇති තත්වය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සෙසු සංවිධාන සූදානමින් සිටියි.

ICRC සංවිධානය මුලතිව් හා ස්වාධීන සේවාවක් අරඹා ඇත. එක්සත් ජාතීන්ගේ සෙනෙට් මණ්ඩලයේ දී ශ්‍රී ලංකාව සම්බන්ධ-යෙන් විවේචනාත්මක වාර්තා තුනක් ලබා දීම සිදු කෙරුණු අතර මේ සම්බන්ධයෙන් ප්‍රධානීන්ගේ අදහස් ද බොහෝ සේ දැඩි විය.

# දිස්ත්‍රික්ක විශ්ලේෂණ - 2009 ජනවාරි 28 - 2009 පෙබරවාරි 28

## අම්පාර

**ව්‍යුහයන්**

මාස කිහිපයක් තිස්සේ දිස්ත්‍රික්කය පුරා පැවති සාමකාමී බවට බාධා පමුණුවමින් කරමැටිය-ාවේ ගම්මානයකට එල්ල වූ දරුණු ප්‍ර හාරයෙන් ගම්වැසියන් 21 දෙනෙක් ජීවිතක්ෂයට පත් විය. මේ ප්‍රහාරයේ දරුණු කම නිසා ජනතාව කම්පනයට පත් වී සිටින අතර මා-යිම් ගම්මානවල ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු මතු වී තිබේ. අත්‍යවශ්‍ය ම කරුණක් හැර වෙනත් යමක් වෙනුවෙන් නිවෙස්වලින් පිටතට යෑමට ගම්වැසියන් පැකිලෙමින් සිටිති. මේ නිසා දෛනික කටයුතු අඩපණ වී ඇත. මේ අතර මේ ප්‍රහාරයේ වගකීම එල්ටීටීඊ සංවිධානය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත.
ටීඑම්වීපී පක්ෂය තුළ ඇති අසහනකාරීබව ද වැඩි වෙමින් පවතියි. මේ අසහනකාරීබව ගැටුම්වලට මග පාදනු ඇති බවට උපකල්පනය කරමින් ජනතාව නොසන්සුන් වී ඇත.
රජය, ආධාර සපයන ආයතන හා වෙනත් රජවල උපකාර සහිතව සංවර්ධන කටයුතු විශේෂයෙන් ම මහා මාර්ග හා වාරි මාර්ග ඉදි කිරීම් ආරම්භ කර ඇති අතර මේ හේතුව නිසා ප්‍රජා සහ-සම්බන්ධතා වැඩි දියුණු වී ඇති ආකාරය පෙනේ. ප්‍රාදේශීය දේශපාලකයින් ද ක්‍රියාකාරීව සංවර්ධන කටයුතුවලට දායක වෙති.

**ක්‍රියාකාරීන්**

රජයේ ආරක්ෂක අංශ, එල්ටීටීඊ සංවිධානය, ටීඑම්වීපී නායක හා ප්‍රධාන අමාත්‍ය, රජය, දේශපාලකයින් හා ආධාර සපයන ආයතන දැනට පවතින සන්දර්භය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සැලකිය හැකි වේ.

**ක්‍රියාත්මක වන ආකාරය**

කරමැටියාවේ සිදු වූ දරුණු ප්‍ර හාරයෙන් ගම්වැසියන් 21 දෙනෙක් ඝාතනයට ලක් වූ අතර මෙය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ආකාරයට දැඩි බලපෑමක් ඇති කර ඇත. මේ තත්වය නිසා ප්‍රජාවන් අතර පවතින පහසුවෙන් බිඳෙන සුළු වූ සාමය බිඳී යෑමට ඉඩ ඇති අතර දිස්ත්‍රික්කය තුළ අස්ථාවර භාවයක් ඇති කිරීමට එය හේතු වනු ඇත. මේ වර්ධනය වන අසහනකාරී තත්වය හමුවේ ටීඑම්වීපී සංවිධානය ද ඉතාම වැදගත් සාධකයක් බවට පත් වෙමින් ඇත. පක්ෂය තුළ වර්ධනය වෙමින් පවතින නොසන්සුන් තත්වය දිස්ත්‍රික්කය පුරා පැතිර යනු ඇති බවට මහජනතාව බියෙන් පසුවෙති.

**ක්‍රමෝපායන් හා විකල්ප**

රජය විසින් ආරම්භ කරන ලද අම්පාර නැවත ගොඩනැගීමේ වැඩසටහන ප්‍රජා සමබන්ධතාවන් වෙනස් කිරීමට හේතු වී තිබේ. දිස්ත්‍රික්කට සංවර්ධනය කර එහි තත්වය ඉහළ නැංවීමේ කාර්යයහි ලා දේශපාලන පක්ෂ හා ප්‍රජා සංවිධාන භේද දුරලමින් එක්වී සිටිති.
මායිම් ගම්මානවල ආරක්ෂාව ඉහළ දැමිය යුතු වේ. එසේම අනාගතයේ ඇති විය හැකි ප්‍ර හාරයන්ට මුහුණ දීම සඳහා ගම්වැසියන් සූදානම් කරවීම ද අත්‍යවශ්‍ය කාර්යයකි. මේ යටතේ අනතුරු ඇඟවීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සිදු කළ හැක. එවිට අනාගතයේ කිසියම් ප්‍ර හාරයක් ඇති වුවහොත් ආරක්ෂක අංශවලට ඒ බව දැනුම් දෙනු ලැබ කඩිනමින් අදාළ ස්ථාන වෙත ළඟා වීමට හැකි වනු ඇත.

## මඩකලපුව

**ව්‍යූහයන්**
අම්පාරේ මායිම් ගම්මානයකට සිදු වූ ප්‍රහාරය නිසා මඩකලපුව දිස්ත්‍රික්කයේ තත්වය ද නොස-න්සුන් වී ඇත. ටීඑම්වීපී පක්ෂයේ ඇති වූ ගැටුම්කාරී තත්වයේ ප්‍රතිඵලයක් සේ එහි නායක කරුණා හා අම්පාර දිස්ත්‍රික් භාර නිලධාරී ඉනිය භාරතී මහතා ඉවත් කිරීම ද මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ අවධානයෙ යොමු වී ඇති කාරණයකි. මෑතක දී ප්‍රබල ටීඑම්වීපී සාමාජිකයන් කිහිප දෙනෙක් ඝාතනයට ලක් වූ අතර වෙනත් අභඹු ඝාතන ද වාර්තා විය.

ආයතනමය මෙන් ම මූල්‍යමය සීමා පැනවීම් නිසා බොහෝ රාජ්‍ය නොවන සංවිධාන සිය කාර්ය මණ්ඩලයන් අඩු කරමින් සිටියි. මෙහි ප්‍රතිඵලයක් සේ බිහි වූ නව රැකියා විරහිතයන් අතර අසහනකාරී තත්වයක් ගොඩනැගෙමින් ඇත. කලින් ලද අත්දැකීම්වලට අනුව මෙය දිස්ත්‍ර ික්කය තුළ නොසන්සුන්බවක් ඇති කිරීමට හේතු වීමට ඉඩ තිබේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි ලා බොහෝ විට සංවර්ධන ආයතනවල දායකත්වය අත්‍යවශ්‍ය නිසා රජය විසින් ආරම්භ කරන ලද සංවර්ධන කටයුතු ද අඩපණ වී ඇත.

ටීඑම්වීපී සංවිධානය මගින් ළමා සොල්දාදුවන් පිරිසක් මුදා හැර ඇත. ටීඑම්වීපී නායක කරුණා පැවසූ අන්දමට එම සංවිධානය තුළ සිටින සියලු ළමා සොල්දාදුවන් මුදා හැරෙනු ඇත. එහෙත් ඔහු නායකත්වයෙන් ඉවත් වීමත් අළුතින් නායකයෙක් පත් වීමත් සමග මේ පොරොන්දුව ඒ ආකාරයෙන් ම ඉටු වනු ඇත්ද යන බවට සැක මතු වී ඇත.

**ක්‍රියාකාරීන්**
ටීඑම්වීපී හිටපු නායක හා ප්‍රධාන අමාත්‍ය, රජයේ ආරක්ෂක අංශ, දේශපාලකයින්, මානුෂීය හා සහන සේවා ආයතන හා පැරා මිලිටරි කණ්ඩායම් දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මක වන ආකාරය**
ටීඑම්වීපී නායක කරුණා ඉවත් කිරීම හා එක්සත් ජනතා නිදහස් සංධාන රජයට එක්වීමට ඔහු තුළ ඇති අපේක්ෂාවන් පළ කිරීම නිසා

දිස්ත්‍රික්කය තුළ ඒ පිළිබඳ දැඩි අවධානයක් යොමු වෙමින් ඇත. මේ තත්වය නිසා ඔහුගේ ආධාරකරුවන් හා දැනට සිටින ටීඑම්වීපී නායකයින්ගේ ආධාරකරුවකන් අතර තාවකාලික නොසන්සුන්තාවක් ඇති වීමට ඉඩ ඇත. ටීඑම්වීපීය මගින් ළමා සොල්දාදුවන් පිරිසක් මුදා හැරීම හා සියලුම ළමා සොල්දාදුවන් මුදා හරින බවට පොරොන්දු ලබා දීම නිසා දෙමාපියන් තුළ අපේක්ෂා දල් වී තිබේ. එහෙත් ටීඑම්වීපීයේ නායකත්වය වෙනස් විම නිසා මේ තීරණය ගැටලුවට භාජනය වී ඇති අතර මෙය දෙමාපියන් තුළ නොසන්සුන් බවක් ඇති කරවීමට හේතු වී ඇත.

තරුණයින් අතර විරැකියාව ඉහළ යමින් තිබීම ද නොසන්සුන්කාරී තත්වයන් ඇති කිරීමට හේතු වීමට ඉඩ තිබේ.

**ක්‍රමෝපායන් හා විකල්ප**

රාජ්‍ය නොවන සංවිධානවල කාර්ය මණ්ඩලයන් හා ආරක්ෂාව තහවුරු කිරීමට හා දැනට පනවා ඇති සීමා ලිහිල් කිරීමට රජය විසින් පියවර ගන්නේ නම් එම සංවිධානවලට වඩාත් කාර්යක්ෂම ව සිය කටයුතු කරගෙන යෑමට හැකි වනු ඇත. එසේ ම සංවර්ධන කටයුතු ද වඩාත් කඩිනමින් සිදු කිරීමට මෙයින් ඉඩකඩ සැළසේ. රාජ්‍ය නොවන සංවිධානවලට මහා පරිමාණයෙන් කටයුතු කිරීමට ඉඩකඩ සළසා දීම මගින් සංවර්ධන කටයුතු වඩාත් කඩිනම් වනවා මෙන් ම දිස්ත්‍රික්කය තුළ රැකියා අවස්ථා සැලසීමට ද හැකි වනු ඇත.

එසේ ම දිස්ත්‍රික්කය තුළ ප්‍රජාවන් අතර ඇති සහසම්බන්ධතා වැඩි දියුණු කිරීමට අදාළ බළධාරීන් මෙන් ම මානුෂිය සංවිධාන ද පියවර ගත යුතුය. මේ මගින් දිස්ත්‍රික්යේ සිවිල් වැසියන් අතර සාමය තහවුරු කිරීමට හැකි වනු ඇත.

## කොළඹ

**ව්‍යුහයන්**

එල්ටීටීඊ සංවිධානය විසින් කොළඹ නගරයට නැවත ගුවන් ප්‍රහාරයක් එල්ල කිරීමට තැත් කිරීම නිසා නගරයේ ආරක්ෂාව නැවත තර්ජනයට ලක් වී ඇති ආකාරය පෙනුණි. එසේම ඉතාම සිමිත වර්ග කිලෝ මීටර් ගණනකට කොටු වෙමින් සිට වුවත් එල්ටීටීඊය සතුව පවතින ගුවන් බලය කතාබහට ලක් විය. මේ ගුවන් යානා එකකට පුපුරන ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 200 පමණ පුරවා ඇති බව වාර්තා වූ අතර මේ ප්‍රහාර නිසා පුද්ගලයින් දෙදෙනෙක් ජීවිතක්ෂයට පත් වී 50කට අධික පිරිසක් තුවාල ලැබූහ.

ඉදිරියට පැවැත්වීමට නියමිත බස්නාහිර පළාත් මැතිවරණයට දේශපාලන පක්ෂ සූදානම් වෙමින් සිටියි.

දැයට කිරුළ ප්‍රදර්ශනය ද පෙබරවාරි මාසය තුළ සිදු වූ සුවිශේෂ සිදු වීමක් සේ දැක්විය හැකි වේ. මේ ප්‍රදර්ශනය නැරඹීමට 1000,000 අධික පිරිසක් පැමිණ බව වාර්තා විය. මෙහි දී එල්ටීටීඊ සංවිධානය වෙතින් අත්පත් කර ගන්නා ලද අවි ආයුධ ද ප්‍රදර්ශනය විය.
මේ අතර හිස ඔසවමින් පවතින ඩෙංගු වසංගතය ද අවධානයට ලක් වෙමින් තිබේ. මදුරුවන් බෝවන ස්ථාන විනාශ කරන ලෙද කොළඹ මහ නගර සභාව ජනතාවගෙන් ඉල්ලා සිටිති.

**ක්‍රියාකාරීන්**

එල්ටීටීඊ සංවිධානය, රජයේ ආරක්ෂක අංශ හා දේශපාලන පක්ෂ වත්මන් සන්දර්භය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මක වන ආකාරය**

රජයේ ආරක්ෂක අංශ විසින් වලක්වන ලද ගුවන් ප්‍රහාරය නැවතත් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රශ්න මතු කර ඇත. යුද්ධය දිගින් දිගටම සිදු වත්ම මේ ආකාරයේ ප්‍රහාර එල්ල වීම සම්බන්ධයෙන් ජනතාව භීතියට පත් ව සිටිති. බොහෝ දෙනෙක් රජයේ පොරොන්දුවලට අනුව මේ වසරේ අප්‍රේල් මාසය වන විට යුද්ධය අවසන් වනු ඇති බවට විශ්වාසය පළ කරති. මේ සම්බන්ධයෙන් විරුද්ධ මත දරණ අය ද වෙති.

ජීවන වියදම දිනෙන් දින ඉහළ යමින් පවතියි. මේ නිසා ජනතාව පීඩනයට පත් ව සිටිති. මේ අතර ජනතාවට සහන ෂලසමින් ගෑස් මිල රුපියල් තුන්සීයකින් පහළ දැමීම සිදු විය. එහෙත් ඒ හා සමගාමීව සෙසු භාණ්ඩවල මිළ අඩු වීමක් තවම සිදු වී නොමැත.

**ක්‍රමෝපායන් හා විකල්ප**

නිරන්තරව අවධානයෙන් සිටීමට ජනතාවට සිහිපත් කළ යුතු වේ. නගරයේ ආරක්ෂිත කලාපවලින් ඈත් ව සිටීම වැනි ක්‍රියාමාර්ග කෙරෙහි ද සිත යොමු කරවිය හැකිය.

පැතිරෙමින් පවතින ඩෙංගු හා චිකන්ගුන්යා තත්වය පාලනය කිරීමට මදුරුවන් බෝවන ස්ථාන විනාශ කර ඒවා පිරිසිදු ව තබා ගැනීම සම්බන්ධයෙන් අදාළ ආයතන පියවරගෙන තහවුරු කළ යුතුය.

## යාපනය

**ව්‍යුහයන්**

එල්ටීටීඊ සංවිධානය හා රජයේ ආරක්ෂක අංශ අතර ගැටුම් දිගින් දිගටම සිදු වෙද් දී මුලතිව් හි එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සිවිල් වැසියන් සිරවී සිටින බවට වාර්තා ලැබී ඇත. පසුගිය මාස දෙකක කාලය පුරා යාපනයේ සිට වව්නියාවට යන සිවිල් වැසියන් මුහුණපාන දුෂ්කරතා සම්බන්ධයෙන් රජයේ හා බොහෝ අන්තර්ජාතික සංවිධානවල අවධානය යොමු වී ඇත. වාර්තාවලට අනුව පවුල් 700 පමණ බෝට්ටු මගින් යාපනයට පැමිණ ඇත.

යාපනය අර්ධ ද්වීපයේ ආරක්ෂාව තර කර ඇති අතර අහඹු පරීක්ෂා කිරීම් හා සෝදිසි මෙහෙයුම් දිගින් දිගටම සිදු වේ. මෙහි මූලික අරමුණ වන්නේ අභ්‍යන්තර අවතැන් වූවන් බවට අඟවමින් එල්ටීටීඊ සාමාජිකයන් යාපනයට පැමිණීම වැලැක්වීමයි.

දිගින් දිගටම සිදුවන දරුණු ගැටුම් හමුවේ පැරා මිලිටරි ක්‍රියාකාරකම් ක්‍රම ක්‍රමයෙන් අඩු වී යන බව පෙනේ.

යාපනයේ භාණ්ඩ හා සේවාවන් හි මිල පහළ බැස ඇත. මේ අතර භාණ්ඩ හා සේවා සැපයීම ද සාපේක්ෂ වශයෙන් ඉහල නැග ඇත. භාණ්ඩ ප්‍රවාහනය සඳහා A9 මාර්ගය විවෘත කරනු ලැබුවහොත් භාණ්ඩ මිල තව දුරටත් පහළ යනු ඇති බව අපේක්ෂා කෙරේ.

**ක්‍රියාකාරීන්**

රජයේ ආරක්ෂක අංශ, එල්ටීටීඊ සංවිධානය හා අභ්‍යන්තර අවතැන්වූවන් ප්‍රධාන ක්‍රියාකාරීන් වේ.

**ක්‍රියාත්මකවන ආකාරය**

මුලතිව් හි සිරවී සිටින සිවිල් වැසියන් මුහුණපාන දුෂ්කරතා දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන වශයෙන් ම අවධානයට ලක් වූ කාරණය බවට පත් වී ඇත. එසේම මෙය රජයේ ද අවධානයට ලක් වී තිබේ. ඉදිරි මාසවලදී යුද්ධය තවදුරටත් දරුණු වනු ඇති බවට මත පළ වෙන අතර මේ හේතුව නිසා මුලතිව් හි සිරවී සිටින සිය නෑ මිතුරන් ගේ තත්වය සම්බන්ධයෙන් මහ ජනතාව දැඩි අවධානයෙන් සිටිති. සිවිල් වැසියන්ට තුවාල සිදු නොකර ඔවුන්ට නිදහසේ පැමිණීමට අවකාශ සළසන මෙන් මානුෂීය සංවිධාන රජයේ ආරක්ෂක අංශ මෙන් ම එල්ටීටීඊ සංවිධානයෙන් ද ඉල්ලීම් කර ඇත. ළමා සොල්දාදුවන් සේවයට එක් කර ගැනීම සම්බන්ධයෙන් යුනිසෙෆ් සංවිධානය එල්ටීටීඊයට චෝදනා කර තිබේ.

**ක්‍රමෝපායන් හා විකල්ප**

උතුරේ යුධ තත්වය දරුණු වත්ම විශාල වශයෙන් පැමිණෙන අභ්‍යන්තර අවතැන් වූවන්ට සහන සැපයීමට රජය මෙන් ම මානුෂීය සංවිධාන සූදානම්ව සිටිය යුතු වේ. නැවත පදිංචි කරවීම සඳහා තෝරාගෙන ඇති ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු කඩිනම් කිරීම අදාළ අංශ පියවර ගත යුතුය. දැනට සිටින අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පදිංචි කරවීමෙන් අළුතින් පැමිණෙන අභ්‍යන්තර අවතැන් වූවන්ට ඉඩකඩ සළසා දිය හැකි වනු ඇත. මේ මගින් අභ්‍යන්තර අවතැන් වූවන්ට සේවා සැපයීමේ කාර්යය යම්තාක් දුරකට පහසු කර ගැනීමට හැකිවේ.

අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ශාරීරික පීඩාවලට ප්‍රතිකාර කරන්නා සේ ම බොහෝ කම්පන තත්වයන්ට මුහුණ පා සිටින මොවුන්ගේ මානසික පීඩා හඳුනා ගන්නා උපදේශන ක්‍රියාවලියක් සිදු කිරීමත් වැදගත් වේ.

## මන්නාරම

**ව්‍යුහයන්**

රජයේ ආරක්ෂක හමුදා එල්ටීටීඊ සංවිධානයේ බල ප්‍රදේශයන් යටත් කර ගනිමින් මන්නාරමට පැමිණෙමින් සිටින අභ්‍යන්තර අවතැන්වූවන් ගේ සංඛ්‍යාව වැඩි වෙමින් පවතියි. 800 කට අධික අවතැන් වූවන් වෙනුවෙන් නව කඳවුරු තුනක් විවෘත තර ඇත. මේ අතර විශ්වමඩු සිට උදයර්කට්ටුදක්වා ප්‍රවාහනය වීමට බලාපොරොත්තුවෙන් තවත් විශාල ප්‍රමාණයක් දෙනා රැඳී සිටිති. වව්නියාව රෝහලේ සිට මන්නාරම රෝහල වෙත එවනු ලැබූ රෝගීන් සංඛ්‍යාව සියයකට අධික වේ. තවත්

සිය ගණනක් ත්‍රිකුණාමලයේ සිට එනු ඇති බවට අපේක්ෂා කෙරේ. පසුගිය සති කිහිපය පුරා ම පැමිණි මෙම පුද්ගලයන් අතර ඩෙංගු හා චිකන්ගුන්යා රෝගීන් කිහිප දෙනෙක් සොයා ගනු ලැබ ඇත.

මීට වසර එකහමාරකට පෙර සිය නිවෙස් අත්හැරීමට බලපෑම් කරනු ලැබූ මුසලෛ ප්‍රදේශයේ අභ්‍යන්තර අවතැන්වූවන් කඩිනමින් නැවත පදිංචි වීමේ බලාපොරොත්තුවෙන් සිටිති. කෙසේ වෙතත් නැවත පදිංචි වීම සඳහා වෙන් කර ඇති භූමි භාගයන් මි වළලා ඇති බිම් බෝම්බ ඉවත් කරන තෙක් නැවත පදිංචි කරවීමට නොහැකි බව රජය විසින් දන්වනු ලැබ ඇත.

ප්‍රදේශයේ ආරක්ෂක තත්ත්වය දැඩි කර ඇති අතර උතුරු ප්‍රදේශයේ සිට සෙසු ප්‍රදේශ කරාවන ජන සංචලනය සීමා කර තිබේ.

මේ අතර ජංගම දුරකථන හා සීඩීඑම්ඒ දුරකථන ආවරණය මෙන් ම පෞද්ගලික රූපවාහිනී නාලිකාවල ප්‍රවෘත්ති විකාශනයන් තව දුරටත් සිදු නොවේ.

පැරාමිලිටරි කණ්ඩායම්වල ක්‍රියාකාරීත්වය වැඩි දියුණු වී ඇති අතර සමහර කණ්ඩායම් රැස්වීම් පවත්වමින් වෙළඳුන්ගෙන් මාසික ආධාර මුදලක් එකතු කර ගන්නා බවට වාර්තා වී ඇත.

UNOP විසින් මන්නාරමේ ජලාපවහන පද්ධතියක් ආරම්භ කර ඇත. මේ හේතුවෙන් ප්‍රදේශයේ තරුණයන්ට රැකියා අවස්ථා ලැබී තිබේ. ආරක්ෂක අංශ හා සාමාන්‍ය මහජනතාව අතර සහ සම්බන්ධතාව වැඩි දියුණු වී ඇත.

**ක්‍රියාකාරීන්**

රජයේ ආරක්ෂක අංශ, මානුෂීය හා සහන සේවා සංවිධාන, අභ්‍යන්තර අවතැන් වූවන් හා ප්‍රදේශය තුළ ක්‍රියාත්මකවන පැරා මිලිටරි කණ්ඩායම් ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මකවන ආකාරය**

ආරක්ෂක තත්ත්වය දැඩි කර තිබීම මහජනතාව අතර නොසන්සුන් බවක් වර්ධනය කිරීමට හේතු වී තිබේ. ගැටුම් තව දුරටත් බැරෑරුම් වනු ඇති බවට ඔවුන් බිය පළ කරමින් සිටිති. වරින් වර කලින් නොදන්වා සිදු කරන ගමනාගමන සීමා කිරීම් නිසා සිවිල් වැසියන් අසතුටට පත් වූ සිටිති. මෙය වෛද්‍ය ප්‍රතිකාර පතා යන රෝගීන්ට, රැකියා අපේක්ෂිතයන්ට, විදෙස් ගත වන්නන්ට මෙන්ම සිය අවශ්‍යතා සඳහා දිවයිනේ වෙනත් ප්‍රදේශ කරා යෑමට බලාපොරොත්තුවෙන් සිටින පුද්ගලයින්ට ද බලපායි.

කාලිමොටෛ හා සිරුකන්දල් කඳවුරුවල ගමනාගමන සීමා කිසියම් දුරකට ලිහිල් කර ඇති අයුරු පෙනේ. මේ අනුව පවුලේ එක් සාමාජිකයෙන් කඳවුරේ රඳවා සෙසු අයට බැහැර යාමේ හැකියාව ඇත. මෙම පියවර, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ තත්ත්වය නිසියම් දුරකින් ඉහළ නැංවීමට සමත් වී ඇති අතර සෙසු කඳවුරුවලට ද මෙය ආදේශ කර ගත හැකි වේ.

**ක්‍රමෝපායන් හා විකල්ප**

රජය විසින් දිස්ත්‍රික්කය තුළ පවතින ආදායම් උපයන මාර්ග හඳුනාගත යුතු වේ. එසේම එම කටයුතුවල යෙදීමට වැසියන් දිරි ගැන්විය යුතුවේ. නිසි ආදායම් මාර්ගයක් නොමැති වීම නිසා කලකිරීමට පත්ව සිටින තරුණයින් පැරා මිලිටරි ක්‍රියාකාරකම්වලින් වලක්වා ඵලදායී කටයුත්තක නිරත කරවීම සඳහා මෙය වැදගත් වනු ඇත.

බිම්බෝම්බ ඉවත් කිරීම සඳහා රජය විසින් පැහැදිලි ක්‍රියාමාර්ග ගත යුතුවේ. මේ කටයුත්තේ දී මානුෂීය හා සහන සේවා ආයතන සමග එක්ව කටයුතු කරමින් මෙම ක්‍රියාවලිය වඩාත් කඩිනම් කිරීමට පියවර ගත යුතුය. එවිට නැවත පදිංචි කරවීමේ ක්‍රියාවලිව වඩාත් කඩිනම් කළ හැකි වනු ඇත.

## ත්‍රිකුණාමලය

**ව්‍යූහයන්**

ත්‍රි කුණාමලයේ ආරක්ෂක තත්වය දැඩි වී පවතියි. පරීක්ෂා කිරීම් හා සෝදිසි මෙහයුම් දිගටම සිදු වෙමින් පවතියි. වාර්තාවන කාලසිමාව තුළ අත් අඩංගුවට ගැනීම් කිහිපයක් ම වාර්තා විය.

ගැටුම් නිසා තුවාල ලැබූ දරුවන් ඇතුළු සිවිල් වැසියන් සිය ගණනක් පුදුකුඩුඉරිප්පු හා වන්නියේ සිට ත්‍රිකුණාමලය මහ රෝහල වෙත එවනු ලැබ ඇත. දිගින් දිගටම රෝගීන් පැමිණෙමින් ඇති අතර ත්‍රිකුණාමල මූලික රෝහලට හා සෙසු රෝහල්වල ඖෂධ හා කාර්ය මණ්ඩල අවශ්‍යතාව දැඩි සේ පැන නැගී ඇත.

1990 ස්ථාපනය කරන ලද අල්ලස් උයන සුභසාධන කඳවුරේ සිටිනඅභ්‍යන්තර අවතැන්වූවන්ගෙන් සමහරෙක් නැවත පදිංචි කරවීමට එරෙහි වී ඇත. දශක දෙකක කාලයක් පුරාවට කඳවුරේ ජීවත් වෙමින් ඔවුන් ඒ ආසන්න ප්‍රදේශවලින් ආදායම් උපයන මාර්ග සොයාගෙන ඇති බවත් මේ නිසා යළි පදිංචි කරවීමෙන් සිය ආදායම් මාර්ග අහිමිවන බවත් ඔවුන්ගේ තර්කයයි.
අභ්‍යන්තර අවතැන්වූවන්ගේ අවශ්‍යතා ආමන්ත්‍රනය කිරීම සඳහා නව ක්‍රමවේදයක් සකස් කර ඇත. මේ අනුව ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් විවිධ මානුෂීය සහන සේවා ආයතන කටයුතු කරනු වෙනුවට සියලු ආධාර උපකාර DPDHS කාර්යාල වෙත ලබා දීම සිදු වන අතර එතැනින් අවතැන් වූවන් වෙත බෙදා හැරීම සිදු වනු ඇත.

**ක්‍රියාකාරීන්**

රජයේ ආරක්ෂක අංශ, එල්ටීටීඊ සංවිධානය, වෛද්‍ය කණ්ඩායම් හා අභ්‍යන්තර අවතැන් වූවන් ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මකවන ආකාරය**

දිගින් දිගටම දිස්ත්‍රික්කය කරා ඇදී එන අවතැන් වූවන්ගේ සංඛ්‍යාව විශාල වන හෙයින් ඔවුන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබා දීම අභියෝගයක් බවට පත් වී තිබේ. ඖෂධවල මෙන්ම වෛද්‍ය කාර්ය මණ්ඩලයේ ද හිඟයක් වේ.

අභ්‍යන්තර අවතැන් වූවන් යලිත් පදිංචි කිරීම තාවකාලිකව නැවතී ඇත. වන්නියේ සිට විශාල වශයෙන් ඇදී එන අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අවශ්‍යතා සැපයීම වඩාත් ප්‍රමුඛ කාර්යය බවට පත් වී තිබේ.

විශාල වශයෙන් අභ්‍යන්තර අවතැන් වූවන් දිස්ත්‍රික්කය කරා ඇදී එත් ම ප්‍රදේශයේ ආරක්ෂාව දැඩි කර ඇත. අභ්‍යන්තර අවතැන් වූවන් බවට අඟවමින් එල්ටීටීඊ සාමාජිකයන් මේ ප්‍රදේශ කරා පැමිණීම වැලක්වීම මෙහි අරමුණ වී තිබේ. මෙම දැඩි ආරක්ෂක තත්වය නිසා බහුතරයක් පිරසගේ සංචලනයට සීමා පැනවී ඇත.

**ක්‍රමෝපායන් හා විකල්ප**

තුවාල ලැබූ සිවිල් වැසියන් ප්‍රමාණයෙන් වැඩි වෙමින් පැමිණෙන හෙයින් ඔවුන්ට අවශ්‍ය වෛද්‍යාධාර සැපයීම සඳහා අතිරේක වෛද්‍ය උපකරණ හා කාර්ය මණ්ඩල යොදවා ගැනීමට අදාල බළධාරීන්ගේ අවධානය යොමු විය යුතු වේ.

රජය අභ්‍යන්තර අවතැන් වූවන් වෙත සපයන ආධාර සම්බන්ධීකරණය කිරීමේ කාර්යයෙහි යෙදී සිටීම සම්බන්ධයෙන් බොහෝ මානුෂීය සංවිධාන අසතුට පළ කර තිබේ. මෙවන් ක්‍රමවේදයක් යොදා ගන්නේ නම් එය විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීමට ත් නිරන්තර පරීක්ෂාවට භාජනය කිරීමටත් පියවර ගත යුතු වේ.

## වවුනියාව

**ව්‍යූහයන්**

මුලතිව් හි පුදුකුඩුඉරුප්පු ප්‍රදේශය ගැටුම්කාරී තත්වය උග්‍රවත් ම දිනපතා දිස්ත්‍රික්කය කරා විශාල සංඛ්‍යාවක් අභ්‍යන්තර අවතැන් වූවන් ඇදී එන ආකාරය පෙනේ. වාර්තාවන කාල සිමාව තුළ පවුල් 7332 අයත් පුද්ගලයින් 30,517 පැමිණි බවට වාර්තා විය. පාසැල්, කාර්මික විද්‍යාල හා විශ්වවිද්‍යාල වැනි අධ්‍යාපන ආයතනවල ගොඩනැගිලි මේ අයට නවාතැන් සැපයීම සඳහා ප්‍රයෝජනයට ගෙන තිබේ. මෙසේ පැමිණෙන පිරිසෙන් බහුතරයක්, මුදා ගත් ප්‍රදේශ කරා ළඟාවීම සඳහා දින තුනක් තිස්සේ කැලෑ මැදින් කිලෝ මීටර් දහයකට වැඩි ප්‍රමාණයක් පයින් ගමන් කර තිබේ.

මේ අතරින් බොහොමයන් දෙනා විජලනයෙන් හා මන්දපෝෂනයෙන් පෙළෙන බව වාර්තා විය. මෙයට තවත් එක් හේතුවක් වූයේ මාසයේ ආරම්භයේ සිට ආහාර බෝට්ටු මුලතිව් වෙත ළඟා නොවීම නිසා ආහාර හිඟ වීමයි. පුදුකුඩුඉරිප්පු වෙත ළඟා වූයේ ආහාර ටොන් කිහිපයක් රැගත් ත්‍රි කුණාමලයේ සිට යැවූ නෞකාවක් පමණි.

වෙඩි වැදීම් හා ෂෙල් ප්‍රහාර ආදී යුධමය ක්‍රියාකාරකම් නිසා බරපතල තුවාල ලැබූ රෝගීන් 600කට ආසන්න ප්‍රමාණයක් ICRC විසින් ගිලන් රථ හා භාණ්ඩ ප්‍රවාහනය කරන ලොරි මගින් වව්නියාව රෝහල වෙත රැගෙනවිත් ඇත. රෝහල්වලට පැමිණෙන රෝගීන් ප්‍රමාණය ඉහල ගොස් ඇති හෙයින් සුළු ප්‍රතිකාර කටයුතු කඳවුරුවල දීම සිදු කරන අපේක්ෂාවෙන් වෛද්‍ය කණ්ඩායමක් වව්නියාවට යවා තිබේ.

මුදා ගත් ප්‍රදේශවල සිට ආරක්ෂිත ප්‍රදේශවලට පැමිණෙද්දී පවුලේ සාමාජිකයන් එකිනෙකාගෙන් වෙන් වී විවිධ කඳවුරුවල තනි වීම නිසා මේ පුද්ගලයන් මානසික වශයෙන් ද දැඩි පීඩාවකට පත් වී සිටිති.

රජය විසින් කඳවුරුවල කඩ, බැංකු හා සමූපකාර ස්ථාපනය කර ඇතත් පළා ආ ජනතාව සතුව මුදල් හෝ සෙසු භාණ්ඩ නොවන අතර ඔවුන්ට මේවායින් ප්‍රතිලාභ ලබා ගත නොහැකි වී ඇත. එසේම

සිය දැවෙන අවශ්‍යතා ඉටු කර ගැනිමට හැකියාවක් නොමැති වීම නිසා ඔවුන් කළකිරීමට හා අපේක්ෂභංගත්වයට පත් වී සිටිති.

මේ අතර වව්නියා වැසියන්ට කිසියම් සහනයක් සළසමින් දුම්රිය සේවාව ආරම්භ වී තිබේ.

වව්නියාවේ අපරාධ සංස්කෘතියක් ගොඩනැගෙමින් ඇති ආකාරයක් පෙනේ. ඝාතනය කිරීම්, පැහැර ගෙන යාම් හා කප්පම් ඉල්ලිම් වාර්තා වී ඇත. දිස්ත්‍රික්කය පුරා සැරිසරන පැරා මිලිටරි කණ්ඩායම් හා ආරක්ෂක අංශ සාමාජිකයන් නිසා නිසා වැසියන් බියට පත් වී සිටිති.

**ක්‍රියාකාරීන්**
අභ්‍යන්තර අවතැන්වූවන්, අන්තර්ජාතින මානුෂීය සංවිධාන, රජයේ බලධාරීන්, රජයේ ආරක්ෂක අංශ හා එල්ටීටීඊ සමාජිකයින් ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මක වන ආකාරය**

දිස්ත්‍රික්කය පුරා පාසැල් වසා දැමීම නිසා සිය දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම සම්බන්ධයෙන් දෙමාපියෝ සිත් තැවුලට පත් වී සිටිති. යුද්ධය නිසා සදාකාලික ආබාධිත වූවන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් නිසා රජය මත විශාල බරක් පැටවී ඇත. ඔවුන් සිය අවශ්‍යතා වෙනුවෙන් රජය මත රැඳී සිටිති. මෙය රජයට මෙන්ම මානුෂිය සහන සේවා සංවිධානවලට ද දැරිය නොහැකි බරක් සේ පවතියි. මේ නිසා අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවල සහන සේවා කටයුතු කිසියම් දුරකට පහළ මට්ටමක පවතියි.

**ක්‍රමෝපායන් හා විකල්ප**

අභ්‍යන්තර අවතැන් වූවන් දැනට සිටින ස්ථාන ජීවත් වීමට කිසිසේත් සුදුසු ස්ථාන නොවන හොයින් ඔවුන්ට සුදුසු ස්ථාන ලබා දීමට රජය ප්‍රමුඛත්වයක ලා සැලකිය යුතු වේ. මෙම නවාතැන් සෞඛ්‍යාරක්ෂිත නොවන අතර කිසි-සේත් ම ප්‍රමාණවත් නොවේ. මෙය වසංගත රෝග පැතිරීයාමට ද හේතුවක් වනු ඇත.

නැවත පදිංචි කරවීමේ කටයුතු මන්දගාමීව සිදු වන්නේ නැවත පදිංචි කිරීම සඳහා තෝරා ගත් ප්‍රදේහවල බිම්බෝම්බ ඉවත් කිරීම් තව දුරටත් සිදුවන බැවිනි. කඳවුරුවලට තව දුරටත් වෛද්‍ය පහසුකම් සැපයීම් වැදගත් වේ. එසේම මානසික වශයෙන් කම්පනයට පත්ව සිටින කඳවුරුවාසීන් ගේ මානසික තත්වය යහපත් කිරීමට පියවර ගැනීම වැදගත් වේ.

නියපොත්තෙන් කැඩීමට ඇති දේ පොරෙවෙන් කැපීමට සිදු වන තෙක් නොසිට පැරා මිලිටරි ක්‍රියාකාරකම් නැවැත්වීමට පියවර ගත යුතු වේ. එසෙත් නැත්නම් එය තවත් යුද්ධයකට මග පාදනු ඇත. රැකියා අවස්ථා සැලසිම මෙයට ගත හැකි ඵලදායී විසඳුමක් සේ සැලකිය හැකිය. මක් නිසාද යත් මේ පැරා මිලිටරි ක්‍රියාකාරකම්වලට සම්බන්ධව සිටින්නේ රැකියා විරහිත භාවය නිසා කලකිරීමට හා අපේක්ෂාභංගත්වයට පත්ව සිටින තරුණයින් වන බැවිනි.

අප ගේ වෙබ් අඩවියට පිවිසෙන්න

http://www.humanitarian-srilanka.org/Knowledge_Centre/ Publications.php

මානුෂිය සේවායතන සමූහය විසින් ඉදිරිපත් කරනු ලබන **ක්ෂණික තතු විමසුම** මගින් මානුෂිය සේවා සහ සංවර්ධන කටයුතුවල නියැලෙන ආයතන සිය සැලසුම් සකස් කිරීමේ දී එක් එක් ප්‍රදේශයේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් එම ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට අනුකූලව මානුෂිය සහ සංවර්ධන කාර්යයන් සැලසුම් කර ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමට අපේක්ෂා කරයි.

එමෙන්ම මෙම **ක්ෂණික තතු විමසුම** මගින් අදාල දිස්ත්‍රික්කයන්හි පවතින සාමයට ගොඩනැගීමට හෝ ගැටුම්වලට තුඩුදෙන සංවේදී තොරතුරු නිරාවරණය කරන හෙයින් ආයතනයන්ට එම ප්‍රදේශවල ගැටුම් ඇති නොවන ආකාරයට සහ ගැටුම් අවම කිරිම/සාමකාමී බවට පරාවර්තනය කිරීමට හා සාමය ගොඩනැංවීමට උපරිම අයුරින් දායක විය ආකාරයෙන් කටයුතු කළ හැකිය.

අවදානම් තත්ත්වය තක්සේරු කිරිම මගින් ආයතනයන්ට තම මෙ-හෙයුම් කටයුතුවල නියැලෙන අතර සිය සේවකයන් ගේ සහ එම ආයතන කටයුතු කරන ප්‍රදේශයේ ජනතාව ගේ ආරක්ෂාව ද තහවුරු කිරීමට හැකියාව ලැබේ.

බාහිර පාර්ශවයන් සලකා බැලීමේ දී (පොදු ජනතාවල ජාත්‍යන්තර ප්‍රජාව) සංදර්භ විශ්ලේෂණය මගින් උද්දේශන සඳහා අවශ්‍යය වන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයන්හි පවතින තත්ත්වය පිළිබඳව ප්‍රමාණවත් මෙ-න්ම සමබර තොරතුරු ලබාදෙයි.

මෙම වාර්තාව පිළිබඳව ඔබගේ අදහස් සහ යෝජනා දැනගැනීමට අපි කැමැත්තෙමු. අපගේ ඊ-මේල් ලිපිනය feedback@cha.lk

මානුෂීය සේවායතන සමූහය,
30/81, ලොන්ඩන් පෙදෙස,
කොළඹ 7

දුර/ෆැක්ස්: 94-112506855/2598413